මානුෂීය සේවායතන සමූහය

මාර්තු 2009

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

## ජාතික විශ්ලේෂණය


| | |
|---|---|
| දේශපාලනය | 2 |
| පාලනය | 2 |
| ආරක්ෂක තත්ත්වය | 2 |
| මානව හිමිකම් | 3 |
| ආර්ථික සන්දර්භය | 4 |
| පරිසරය | 5 |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | 5 |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | 5 |
| බාහිර ක්‍රියාකාරීන් | 6 |


## දිස්ත්‍රික්ක විශ්ලේෂණ


| | |
|---|---|
| අම්පාර | 6 |
| මඩකලපුව | 7 |
| කොළඹ | 7 |
| යාපනය | 7 |
| මන්නාරම | 8 |
| ත්‍රිකුණාමලය | 8 |
| වව්නියාව | 8 |


## ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | → |
| පාලනය | ↘ |
| ආරක්ෂක තත්ත්වය | → |
| මානව හිමිකම් | → |
| ආර්ථික සන්දර්භය | ↘ |
| පරිසරය | ↘ |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | → |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | ↘ |

# සාරාංශය



**දේ**ශපාලනය වශයෙන් සැලකූ කල රනිල් වික්‍රමසිංහ තවදුරටත් සිය නායකයා වශයෙන් තබා ගනිමින් ඉදිරි ගමන යාමට එක්සත් ජාතික පක්ෂය තීරණය කර ඇත. ජනතා විමුක්ති පෙරමුණ සිටින්නේ අවුල්සහගත තත්ත්වයකය. පක්ෂ දහයක ඒකාබද්ධයෙන් තැනුණු එක්සත් ජනතා නිදහස් සංධානය යුද්ධයට පින් සිදු වන්නට ජනප්‍රියත්වයේ හිණි පෙත්තේ සිටින අතර අප්‍රේල් 25 වැනිදා පැවැත්වීමට නියමිත බස්නාහිර පළාත් සභා ජය අපේක්ෂාවෙන් සිටියි.

මාර්තු මාසයේ මුල් භාගයේ දී යුදමය වශයෙන් මර්මස්ථානයක්වන පුදුකුඩුඉරිප්පු නගරය රජයේ හමුදා විසින් අත්පත් කරගන්නා ලදි. දැනට එල්ටීටීඊය සතුව පවතින්නේ වර්ග කිලෝ මීටර් 27 ක භූමි ප්‍රදේශයක් පමණි. මෙය මීට වසර කිහිපයකට පෙර ඔවුන් යටතේ තිබූ භූමි ප්‍රමාණය වන වර්ග කිලෝ මීටර් 15,600 (ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් 24%) 1% න් දහයෙන් දෙකකට සමාන වේ.

ත්‍රස්තවාදීන්ට තවමත් දකුණ ඇතුල්වීමට හැකි බව පෙන්වමින් අකුරැස්සේ දී සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාරයෙන් 11 දෙනෙක් මරුමුවට පත් වී විශාල පිරිසක් තුවාල ලැබූහ. පැහැරගෙන යාම්, අත් අඩංගුවට ගැනීම්, අතුරුදන්වීම් හා ඝාතනයන් උතුරු නැගෙනහිරහි මෙන් ම කොළඹහි ද තවදුරටත් පවතින අතර, පසුගිය මාසය හා සසඳද්දී, මඩකලපුවේ ඝාතනයන්වල ඉහල යාමක් දක්නට විය.

සූඩාර් ඔලි පුවත්පතේ ප්‍රධාන කර්තෘ එන්. විද්‍යාධරන් මහතා හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපති පැහැරගෙන ගෙන ගොස් මුදා හැරීමෙන් පෞද්ගලික මාධ්‍ය මර්ධනය කිරීම තවදුරටත් ක්‍රියාත්මක බව පෙනී යයි.

ළඟ පෙනෙන යුද්ධයේ අවසානය නිසා රට තුළ ඇති විය හැකි පසු යුද සමාජය කෙසේ වනු ඇත්ද යන්න පිළිබඳ ව ගැටලු පැන නැගී ඇත. එක් දෘෂ්ටි කෝණයකින් දකින විට යුදමය වශයෙන් රජය ලබා ඇති සාර්ථකත්වය, රජය, පොදු ජනතාව හා ආරක්ෂක අංශ වඩාත් සමීප කරන යහපත් බලපෑමක් සේ පෙනී යා හැකිය. එහෙත් තවත් අතකින් බලන විට පෙනී යන්නේ යුද ජයග්‍රහණ නිසා ප්‍රජාතන්ත්‍රවාදය යටපත් වීම, හමුදා දේශපාලන කටයුතුවලට මැදිහත් වීම සිදුවීම, වර්ගවාදී නොසලකා හැරීම් ආදී අයහපත් ප්‍රතිඵල සිදුවිය හැකි බවයි.

අභ්‍යන්තර අවතැන්වූවන් හා උතුරේ මානුෂික අර්බුදය පිළිබඳ අවධානය යොමු කරන අන්තර්ජාතික ප්‍රජාව පවසන්නේ මේ සංඛ්‍යාව 50000 සිට 200000 දක්වා වන බවකි. එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ජෝන් හෝම්ස් මහතා මේ ප්‍රදේශවල කළ සංචාරයකින් පසුව අභ්‍යන්තර අවතැන් වූවන්ට ආධාර කිරීම සඳහා ඩොලර් මිලියන දහයක් නිකුත් කර ඇති අතර සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන සේ ඔහු දෙපාර්ශ්වයෙන්ම ඉල්ලා තිබේ. අභ්‍යන්තර අවතැන්වූවන් යුද කලාපයෙන් පිටතට ගන්නා තෙක් වත් සටන් නවත්වන සේ අන්තර්ජාතික ප්‍රජාව විසින් කරන ලද ඉල්ලීමට මේ දක්වා යහපත් ප්‍රතිචාර ලැබී නොමැත. එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවලට, අන්තර්ජාතික රතු කුරුස සංවිධානයට හා සමහර රාජ්‍ය නොවන සංවිධානවලට අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරුවලට ලඟා වීමට වැඩි අවකාශ ඇත. මේ අතර අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් ක්ෂේත්‍ර රෝහලක් ස්ථාපනය කිරීමට ඉන්දියාව කටයුතු යොදා ඇත.

ජනතා විමුක්ති පෙරමුණ යුද්ධයට පක්ෂපාතීත්වයක් දක්වයි. මේ අතර ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂය අවතැන් වූවන් සම්බන්ධයෙන් පවා මුනිවත රකින ආකාරය පෙනේ.

2008 වර්ෂයේ තුන්වන කාර්තුවේ දී ආරම්භ වූ ප්‍රවණතාව තවදුරටත් පවතිමින් උද්ධමනය මධ්‍යම ප්‍රමාණයකට පැමිණ ඇති බව පෙනේ. යුද්ධය ළඟදීම අවසන් වනු ඇති බවට පවතින මතය නිසා ව්‍යාපාර විශ්වාසනීයත්වය කිසියම් දුරකට වර්ධනය වී ඇති ආකාරය දැකිය හැකිය. රාජ්‍ය මූල්‍ය තත්ත්වය දැඩි ආතතියක පවතියි. සපුගස්කන්ද තෙල්පිරිපහදුව වැඩි දියුණු කිරීම සඳහා වන ඩොලර් මිලියන 350 හා විශ්‍රාම වැටුප් අක්‍රමිකතා දුරු කිරීම සඳහා වන රුපියල් බිලියන 15 රජයට සොයා ගත නොහැකි වී තිබේ. භාණ්ඩාගාර බිල්පත්වල දැනට පවතින උපරිම අගය වන රුපියල් මිලියන 600, රුපියල් මිලියන 750 දක්වා ඉහළ දැමීමට රජය ව්‍යවස්ථාවේ සහාය පතමින් සිටියි. මෙය අයවැය හිඟය පියවීමට මුදල් අච්චුගැසීමේ පෙර සූදානමක් විය හැකිය.

ආර්ථික අර්බුදය නිසා සංචාරක කර්මාන්තය හා ඇඟලුම් කර්මාන්තය පීඩා විඳින ආකාරය පෙනේ. තේ මිල ඉහළ නැග ඇතත් පසුගිය කාලයේ පැවති නියඟය නිසා තේ නිෂ්පාදනය පහළ බැස ඇත. ඇඟලුම් මෙන් ම තේ වෙළඳපළේ දී ද ශ්‍රී ලංකාවට තරගකාරීත්වය අහිමි වී යමින් තිබේ. රජය අපනයනකරුවන්ට බදු සහන ලබා දුන්නත් මේ වැඩපිළිවෙල එතරම් පැහැදිලි නොවේ. මේ දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා රජය අන්තර්ජාතික මූල්‍ය අරමුදලින් ඩොලර් බිලියන 1.9 ක ණයක් ඉල්ලා ඇත.

පාරිසරික අතින් සලකා බලන විට දීර්ඝ කාලීන වශයෙන් පැවති නියඟය නිසා අස්වනු අඩු වීම හා ජල විදුලි බලාගාර ආශ්‍රිත ජලාශවල ජල මට්ටම පහළ යෑම සිදු වී තිබේ. මේ තත්ත්වය යම් තාක් දුරකට සමනය කර ගැනීම සඳහා මාසයේ මැද භාගයේ පැමිණි වැසි හේතු විය.

## දර්ශකය

| | | | | | |
|---|---|---|---|---|---|
| *වෙනසක් නැත* | → | *මඳ ප්‍රගතියක් පෙන්වයි* | ↗ | *මඳ පිරිහීමක් පෙන්වයි* | ↘ |
| *සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි* | ↑ | *සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි* | ↓ | | |

# ජාතික විශ්ලේෂණය 27.07.2009- 26.03.2009

## දේශපාලන සංදර්භය



විශාලතම (කථානායක හැර ආසන 42) හා ස්වාධීන තනි පක්ෂය සේ සැලකෙන පාර්ලිමේන්තුවේ පැරණිත ම දේශපාලන පක්ෂය බලාපොරොත්තු වූ පරිදි කඩා වැටීම සිදු වූයේ නැත. දැනට පවතින දූෂිත දේශපාලන පරිපාලන තත්ත්වයට පිළියම් සැපයීමට නම් මෙසේ පැවතීම අතිශයින් වැදගත්වනු ඇත.

දැන් සියල්ල තීරණය කිරීම ඡන්ද දායකයාට භාර වී ඇති අතර කෙසේ වෙතත් ඔහුට තීරණයක් ගැනීම දුෂ්කර වනු නොඅනුමානය. බහුතරයක් වන දිළිඳු ජනතාවට බලයට පැමිණෙන්නේ කවුද යන කාරණය වැදගත් නොවේ. දේශපාලන පක්ෂ සියල්ල ම එක හා සමාන වේ. ඔවුහු සියලු දෙනාම හුදෙක් ජනතාව දක්ෂ ලෙස රවටමින් සිටිති. මේ තත්ත්වයෙන් වඩාත් ම පීඩාවට පත් වන්නේ මධ්‍යම පාන්තික ජනතාව හා මධ්‍යම පන්තියට ඇතුලු වෙමින් සිටින ජනතාවයි. කිසියම් වෙනසක් සිදු කළ හැකි එකම පිරිස ඔවුන් වේ. යුද්ධය දිගින් දිගට ම සිදු කරන අතර ජීවන වියදම පහළ දැමීම ඕනෑම රජයකට අපහසු කටයුත්තකි. මක් නිසා ද යත් ශ්‍රී ලංකාව ආනයන භාණ්ඩ මත විශාල වශයෙන් පදනම්වන රටක් බැවිනි.

ආර්ථික වශයෙන් ගත් කල ශ්‍රී ලංකාව සිටින්නේ යහපත් මට්ටමක නොවේ. රුපියල, රුපියල් 132 වන තෙක් නැවත පාවනු ඇත්ද? ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තා කරන ලද ආකාරයට තව මාස 1.3 කාලයක් සඳහා ප්‍රමාණවත් විදේශ හුවමාරු සංචිත පිළිබඳ තත්ත්වය කෙසේ වනු ඇත්ද?

තුන්වන බලවේගය බවට පත්වෙමින් සිටි ජනතා විමුක්ති පෙරමුණ, පක්ෂය බෙදී යෑම හා පැහැදිලි අරමුණක් රහිත වීම නිසා බල අරගලය පිළිබඳ තරගයෙන් ඉවතට විසි වී යන ආකාරය පෙනේ.

මේ අතරතුර සන්ධානය නමින් ප්‍රකට වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය බුලත් කොළය ලකුණින් දේශපාලන පක්ෂ දහයකට වැඩි සංඛ්‍යාවකින් යුතුව ශක්තිමත්ව සිටියි. සන්ධානයට එක් වී සිටින දේශපාලන පක්ෂවලින් සමහරක් සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පොදු ජන එක්සත් පෙරමුණ, MEP, නව සමසමාජ පක්ෂය, මුස්ලිම් කොන්ග්‍රසයෙන් කැඩී ආ අතවුල්ලා කණ්ඩායම, CPSL, NFF, CWC, UPPF හා ආචාර්ය සරත් අමුණුගම හා කරු ජයසූරිය ගේ ප්‍රධානත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂයේ විකල්ප කණ්ඩායම් දෙක දැක්විය හැකිය. කෙසේ වෙතත් කරු ජයසූරිය අංශක 360 හැරීමකින් නැවත එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වී ඇත.

අප්‍රේල් 25 වැනි දා පැවැත්වීමට නියමිත බස්නාහිර පළාත් සභා මැතිවරණය දෙස සියලු දෙනාගේ ම අවධානය යොමු වී තිබේ. බස්නාහිර පළාත වැඩිම ජනගහනයක් සිටින පළාත සේ හැඳින්විය හැකි අතර ප්‍රධාන දිස්ත්‍රික්ක තුනක් සේ හැඳින්විය හැකි කොළඹ, ගම්පහ හා කළුතර මේ පළාතට අයත් වේ. යුද්ධය නවත්වනවා ද එසේත් නැත්නම් දිනෙන් දින අගාධයට යමින් පවතින ආර්ථිකය ගොඩ ගැනීමට කටයුතු කරනවා ද යන්න තීරණය කිරීම සඳහා මේ මැතිවරණය තීරණාත්මක සාධකයක් වනු ඇත.

## පාලනය



පසුගිය සති කිහිපය පුරාවට ම යුධ ජයග්‍රහණ වෙත යොමු වී තිබූ අවධානය දැන් දැන් මානුෂික අර්බුදය වෙත යොමුව ඇති අයුරු දක්නට වේ. මේ මානුෂික අර්බුදයට පිළියමක් සේ විදෙස් රටවල් දක්වන්නේ මානුෂීය සටන් විරාමයක් ඇති කර සිවිල් වැසියන් අදාළ ප්‍රදේශවලින් ඉවත් කර ගැනීමයි. සිවිල් වැසියන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන නිසා ආරක්ෂිත කලාපයන් හි බර අවි භාවිතය වැළැක්වීමට රජය විසින් ප්‍රකාශ නිකුත් කර ඇත. ආරක්ෂිත කලාපයන් හි සිටිමින් හෝ ඒවාට ආසන්නයෙන් සිටිමින් රජයේ හමුදාවන්ට ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් එල්ටීටීඊ සංවිධානයට චෝදනා එල්ල වී තිබේ.එසේ ම ආරක්ෂිත කලාපවලට ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් රජයේ හමුදාවලට චෝදනා එල්ල වී ඇත. මෙසේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් ඇතුලු අන්තර්ජාතික ක්‍රියාකාරීන් ගේ විවේචනයට ලක් වී තිබේ. දැනට පවතින අර්බුදයේ තවත් අයහපත් සාධකයක් වන්නේ ප්‍රධාන විපක්ෂයට යම් හේතුවකින් ඉදිරියේ දී රටේ පාලනය පැවරුනහොත් මේ ගැටලු ආමන්ත්‍රණය කිරීමට ඔවුන්ගේ ම වූ පැහැදිලි ක්‍රමවේදයක් නොමැති වීමයි. ජනතා විමුක්ති පෙරමුණ යුද්ධයට සිය සහයෝගය පල කරන මුත් ප්‍රධාන විපක්ෂයවන එක්සත් ජාතික පක්ෂය රට සාර්ථකත්වය කරා ගෙන යෑමට නම් කෙසේ කටයුතු කළ යුතු ද යන්න පිළිබඳව සිය මතය පළ කිරීමෙන් වැලකී සිටියි. මේ ගැටලුවලට රජයට ම විසඳුම් සොයා ගැනීමට ඉඩහැර නිසොල්මනේ බලා සිටින ආකාරයක් ඔවුන් වෙතින් දිස්වේ. මෙම ප්‍රවේශය ඕනෑම දෙයක් සිදු වීමට ඉඩ හැර බලා සිටීමක් සේ දැක්විය හැකිය. වාර්තාවන අන්දමට නායකත්වය පිළිබඳ ගැටලු නිසා හා යුද්ධය පිළිබඳ ගැටලු නිසා එක්සත් ජාතික පක්ෂය කණ්ඩායම්වලට බෙදී ඇත. එක් පාර්ශ්වයක අදහස වන්නේ රට ජාතිය ගැන සිතා යුද්ධයේ දී රජයට සහයෝගය දිය යුතු බවයි. මාසයේ අගභාගය වන විට නායකත්වය පිළිබඳ අර්බුදය අවසන් වී ඇති ආකාරය පෙනුණි. දැන් ප්‍රධාන විපක්ෂයට නැවත යුද්ධය පිළිබඳ සිය ස්ථාවරය ගැන සිතා බැලිය හැකිය.

අන්තර්ජාතික වශයෙන් මානුෂිකත්වයට එරෙහිව සිදුවන අපරාධ සේ සැලකෙන ක්‍රියාවල අනියම් ප්‍රතිලාභවලින් පමණක් විපක්ෂ නායකත්වයට රජය පෙරළා බලය ලබා ගත නොහැකි වනු ඇත. ඒ වෙනුවට විපක්ෂය විසින් සිදු කළ යුත්තේ යුද්ධයෙන් සිදුවන හානි ප්‍රමාණය වලක්වා ගැනීමට රජයට අවශ්‍ය සහාය හා උපදෙස් ලබා දෙමින් රජය මත පැටවී ඇති අන්තර්ජාතික පීඩනය යම්තාක් දුරකට සමනය කිරීමට කටයුතු කිරීමයි. යුද්ධයේ විපාක ලෙස රෝහල්වල හා සුභ සාධන කඳවුරුවල සිරවී සිටින ජනතාවට සමීප වීම ද විපක්ෂය විසින් සිදු කළ යුතුය. යුද්ධයට එරෙහිව හෝ යුද්ධයෙන් ඇතිවන විපාකවලට විරෝධය දක්වමින් අදහස් පළ කිරීම නිසා දෙමළ ජාතිකයින් එල්ටීටීඊ සංවිධානයේ ආධාරකරුවන් සේ සලකා චෝදනා කිරීමේ තත්ත්වයක් ඇති වී ඇති හෙයින් මෙය වලක්වා ඔවුන් සුරක්ෂිත කිරීමට විපක්ෂය පියවර ගත යුතුය. විපක්ෂ නායත්වය, මහජන හා ජාතික නායකත්වයක් සැපයීමට මෙන් ම සිවිල් ජනජීවිතය සුරක්ෂිත කිරීමේ හැකියාවක් සහිත විය යුතුය.

## ආරක්ෂක තත්ත්වය



ශ්‍රී ලංකාව ත්‍රස්තවාදයෙන් මුදා ගැනීම සඳහා දියත් වූ තුන් අවුරුදු හමුදා මෙහෙයුම පුදුකුඩුඉරුප්පු උතුරු ප්‍රදේශයේ ඉරණපලෛ මංසන්ධිය රජයේ හමුදා විසින් අත්පත් කරගනු ලැබීමෙන් පසු ව අවසාන අදියරට ලංවී තිබේ. මේ වන විට ත්‍රස්තවාදීහු වර්ග කිලෝමීටර් 26.5 ප්‍රමාණයකට සීමා වී සිටිති. මෙයට යුධ මුක්ත කලාපය ද ඇතුලත් වේ. D.B.S ජෙයරාජ් කොලමට අනුව ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල එල්ටීටීය යටතේ වර්ග කිලෝ මීටර් 15,600 ට අධික ප්‍රමාණයක් විය.

මාර්තු මස තුන් වැනිදා 58වන සේනාංකය හා 53 වන සේනාංකය විසින් එල්ටීටීඊයේ අවසාන තීරණාත්මක පාලන නගරය සේ හැඳින්වුනු පුදුකුඩුඉරිප්පු නගරය අත්පත් කර ගන්නා ලදි. මේ දක්වා වන කාලසීමාව තුළ රජයේ හමුදා විසින් එල්ටීටීඊය විසින් පාලනය කරන ලද ප්‍රදේශවලින් වර්ග කිලෝ මීටර් 37 පමණ භූමි ප්‍රදේශයක් අත්පත් කරගෙන ඇත. 20වන ගජබා රෙජිමේන්තුව, 7වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව හා 581වන බලකායේ 11වන සුලු අවි සේනාංකය විසින් ඉරනපලෛ මන්සන්ධිය අතපත් කර ගන්නා ලද අතර 58වන බලකාය විසින් පුදුමාතලන් දක්වා දිවෙන මාර්ගයේ සම්පූර්ණයෙන් ම බලය තහවුරු කරගෙන ඇත. මේ වන විට ආරක්ෂිත කලාපයට ඇත්තේ කිලෝ මීටර් දෙකක ප්‍රමාණයක් පමණි. මාර්තු මාසයේ අවසන් සතියේ දී රජයේ හමුදා දෙපැත්තකින් යුද මුක්ත කලාපය වෙත ආසන්න වෙත් දී රජයේ හමුදා හා එල්ටීටීඊ සංවිධානය අතර දරුණු ගැටුම් වාර්තා විය. නන්තිකඩාල් කලපුවේ උතුරු සීමාවේ සිට 8වන කාර්ය බලකාය ඉදිරියට පැමිණෙමින් සිටින අතර 53වන සේනාංකය පුදුකුඩුඉරිප්පු A35 මාර්ගයට සමාන්තරව ඉදිරියට පැමිණෙමින් සිටියි.

මේ අතර අවසානය දක්වා ම සිය සටනට සහයෝගය දෙන ලෙස ඉල්ලමින් එල්ටීටීඊ සංවිධානය විසින් ආරක්ෂක කලාපයේ සිර වී සිටින සිවිල් වැසියන් අතර පත්‍රිකා මුදා හැර තිබේ. එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන පවසන පරිදි සිවිල් වැසියන් 200,000 පමණ ප්‍රමාණයක් වන්නි ප්‍රදේශයේ සිරවී සිටින අතර රජයේ වාර්තාවලට අනුව මෙම සංඛ්‍යාව 50,000 - 70,000 අතර සංඛ්‍යාවක් වේ. මාර්තු මාසයේ ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් ජාතීන්ගේ විශේෂ ලේකම් සඳහන් කළේ දිනපතා සිවිල් වැසියන් විශාල ප්‍රමාණයක් මිය යෑම හා තුවාල වීම සිදුවන බවයි. හමුදා ආරංචි මාර්ගවලට අනුව ජනවාරි සිට මේ දක්වා සිවිල් වැසියන් 47,000 ප්‍රමාණයක් හමුදා ආරක්ෂාව පතා පැමිණ ඇත.

ශ්‍රී ලංකා යුද හමුදාවේ 55වන බලකාය

පුදුමාතලන් දකුණු ප්‍රදේශයේ සිට ඉදිරියට ඇදෙන අතර 553වන බල සේනාවට අයත් 1 වන ලංකා සුලු අවි පාබල සේනාංකය පුදුමාතලන් හි පට්ටිකරෙර වෙත ළඟා වී තිබේ. රජයේ හමුදාවලට දරුණු සටන්වලට මුහුණ දීමට සිදු වූයේ එල්ටීටීඊ සංවිධානය මගින් යුද අගල් සටන් ක්‍රම යොදාගෙන තිබීම නිසාය. මේ සටන් ක්‍රමයේ අරමුණ වන්නේ සිය සම්පත් ආරක්ෂා කර ගනිමින් සතුරාගේ සම්පත් විනාශ කර දැමීමයි. එල්ටීටීඊයේ පාලනයට යටත් අවසන් කිලෝ මීටර් කිහිපය අත්පත් කර ගැනීම දුෂ්කර වන්නේ මේ හේතුව නිසා විය හැකිය.

අම්පාර කරමැටියාවේ සිදු වූ ඝාතන වලින් පසු සියඹලාන්ඩුව, ලාහුගල, හුලංනුගේ, බක්මිටියාව, පන්නල්ගම හා මාන්තෝට්ටම යන ගම්මාන හයේ ආරක්ෂාව දැඩි කර තිබේ. සිය ගම් ප්‍රදේශයේ අරක්ෂාවක් නොමැති වීමට හේතුව සේ කරමැටියාව ප්‍රදේශයේ ජනතාව දක්වන්නේ, කරමැටියාව මොණරාගල දිස්ත්‍රික්කයට අයත් වූවත් පොලිස් බල ප්‍රදේශ සම්බන්ධයෙන් සැලකීමේ දී එය අම්පාර දිස්ත්‍රික්කයට අයත් වීම බවයි.

මාධ්‍යවලට එරෙහිව සිදු කරන අරගලය තව දුරටත් සිදුවන බව , සුඩාර්ඔලි පුවත්පතේ ප්‍රධාන කර්තෘ එන්. විද්‍යාධරන් මහතා හා රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපති ආචාර්ය ගංගානාත් දිසානායක මහතා පැහැරගෙන යාමෙන් තහවුරු විය. මේ දෙදෙනා ම පසුව නිදහස් කරන ලදි. ත්‍ර ස්ත භීතිය ක්‍රිකට් ක්ෂේත්‍රයත් ආක්‍රමණය කර ඇති බව පැහැදිලි කරමින් මාර්තු දෙවන දින පකිස්ථානයේ ලාහෝර් නගරයේ දී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය. මෙහිදී ක්‍රීඩකයින් 6 දෙනෙක් තුවාල ලැබූ අතර පකිස්ථානුවන් 8 දෙනෙක් මරණයට පත් විය.

මහනුවර යාපනය යා කරන A-9 මාර්ගය වසර විසි හතකට පසු මාර්තු දෙවන දින උත්සවාකාරයෙන් නැවත විවෘත විය. මේ මාර්ගය ප්‍රධාන වශයෙන් ප්‍රවාහන කටයුතු සඳහා හා ආරක්ෂක හමුදාවල කටයුතු වෙනුවෙන් වෙන් වනු ඇත. සටන් විරාම ගිවිසුමෙන් පසු 2002 අප්‍රේල් මස 8 වැනි දා A-9 මාර්ගය නැවත විවෘත වූ නමුත් මේ වන විට ඕමන්තෙ සිට මුහමලෙ දක්වා ප්‍රදේශය එල්ටීටීඊ පාලනය යටතේ පැවතිණි.

මාතර අකුරැස්සේ ජාතික උත්සවයක් අවස්ථාවේ දී මරාගෙන මැරෙන බෝම්බ-කරුවකු විසින් එල්ල කරන ලද ප්‍රහාරයකින් සිවිල් වැසියන් 14 දෙනෙක් මරුමුවට පත් වූ අතර මේ ප්‍රහාරයෙක් තුවාල ලැබූ රජයේ ඇමතිවරයෙක් තවමත් දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබයි.

ත්‍රස්ත හිතවාදී මාධ්‍ය විසින් වාර්තා කරන අන්දමට එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ශ්‍රී ලංකා හමුදා විසින් සිදු කරන ලද ෂෙල් ප්‍රහාරවලින් සිවිල් වැසියන් 1200 අධික පිරිසක් මරුමුවට පත් වී ඇති අතර 1600 ක් පමණ තුවාල ලබා ඇත. මේ අතරින් 600ක් දරුවන් වේ.

***“අප එක්කෝ එකට මියයා යුතුය. එසේත් නැත්නම් අප එකට ජීවත් විය යුතුය. අප එකට ජීවත් වීමට නම් අප එකිනෙකා හා සාකච්ඡා කළ යුතුය”. - එලිනෝර් රූස්වෙල්ට්***

# මානව හිමිකම්

***පෙබරවාරි 21 වැනිදා සිට මාර්තු 20 දක්වා මානව හිමිකම් විශ්ලේෂණය***

පහත දැක්වෙන ප්‍රස්ථාර විවිධ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය වලින් වාර්තා පදනම් කරගෙන ඇත. (දි අයිලන්ඩ්, ඩේලි මිරර්, ඩේලි නිවුස්, වීරකේසරී, තිනකුරල්, සුඩර්ඔලි, ලංකා පේජ් හා CHA දිස්ත්‍රික් කාර්යාලය)

**පැහැරගෙනයාම් 12**

| |
|---|
| කොළඹ 5 |
| වව්නියාව 3 |
| පුත්තලම 3 |
| මන්නාරම 1 |

**අත්අඩංගුවට ගැනීම් 275**

| |
|---|
| මාතර 141 |
| කොළඹ 55 |
| වව්නියාව 35 |
| නුවර එළිය 15 |
| ගම්පහ 13 |
| ත්‍රිකුණාමලය 12 |
| මන්නාරම 3 |
| අනුරාධපුර 1 |

**අතුරුදන්වීම් 08**

| |
|---|
| මන්නාරම 5 |
| මඩකලපුව 1 |
| කොළඹ 1 |
| ගාල්ල 1 |

**තුවාල සිදුවීම් 432**

| |
|---|
| මුලතිව් 380 |
| මාතර 40 |
| අම්පාර 11 |
| මඩකලපුව 1 |

**මරණ/ඝාතනයන් 162**

| |
|---|
| මුලතිව් 106 |
| අම්පාර 19 |
| මාතර 15 |
| මඩකලපුව 11 |
| මන්නාරම 4 |
| ත්‍රිකුණාමලය 3 |
| මඩකලපුව 1 |
| යාපනය 1 |
| කුරුණෑගල 1 |
| වව්නියාව 1 |

| මරණ/ඝාතනයන් 162 | තුවාල සිදු වීම් 432 |
|---|---|
| බෝම්බ/ෂෙල් ප්‍රහාර 115 | බෝම්බ/ෂෙල් ප්‍රහාර 352 |
| වෙඩි තැබීම් 42 | වෙඩි තැබීම් 41 |
| මළ සිරුරු හමුවීම් 5 | මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර 40 |

**අදාළ කාල සීමාවේ සිදු වූ සුවිශේෂ කරුණු**

- එල්ටීටීඊ සංවිධානයේ අය බවට සැක කෙරෙන පිරිසක් විසින් එල්ල කරන ලද ප්‍රහාරයකින් ඉඟිනියාගල කරමැටිය ගම්මානයේ 16 මිය ගොස් 10 දෙනෙක් දරුණු ලෙස තුවාල ලබා ඇත.
- මාර්තු 16 වන දින සුදු වෑන් රියක් මගින් මුස්ලිම් වැසියන් තිදෙනක් පැහැර ගැනුණු අතර පසුව ඔවුන් නිදහස් කෙරිණි.
- කොළඹ නගරයට එල්ටීටීඊ ප්‍රහාරයක් එල්ල වීමට පසු දින අවිස්සාවේල්ල ප්‍රදේශයේ දෙමළ ගමකට නාඳුනන කල්ලියක් විසින් ප්‍රහාරයක් එල්ල කරන ලදි. මෙහි දී එක් අයෙක් මරුමුවට පත් වූ අතර දේපල හානි ද සිදු විය.
- යාපනය මහනුවර A-9 මාර්ගය භාණ්ඩ ප්‍රවාහන කටයුතු හා ආරක්ෂක අංශ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් විවෘත විය.

- පවුලේ අවමංගලෝ්‍යාත්සවයකට සහභාගී වෙමින් සිටිය දී සුඩර් ඔලි ප්‍රධාන කර්තෘ එන්. විද්‍යාධරන් මහතා පැහැරගෙන යන ලදි.
- වව්නියාවේ පූන්තෝට්ටම් අවතැන්වූවන්ගේ කඳවුරේ ගින්නක් ඇති වූ අතර මෙයට හේතුව විදුලි කාන්දුවක් බව සොයා ගැනිණි.
- යුද කලාපයේ සිටිය සිය මව් පියන් වෙත යෑමට නොහැකි වීම නිසා සිත් තැවුලට පත් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අවසන් වසර සිසුවියක් සිය නේවාසිකාර කාමරයේ දී ගෙළ වැල ලා ගෙන සිය දිවි නසා ගෙන ඇත.
- මාතර, අකුරැස්සේ සිදුවූ මරාගෙන මැරෙන ප්‍රහාරයකින් 13 දෙනෙක් මරුමුවට පත් වී 41 දෙනෙක් පමණ තුවාල ලැබූහ. අමාත්‍ය මහින්ද විජේසේකර ද මේ තුවාල ලැබූවන් අතර වේ.
- අකුරැස්සේ සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාරයෙන් පසු මාතර දිස්ත්‍රික්කයේ දෙමළ වැසියන් 141 දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් නිදහස් කරන ලද්දේ ද යන්න පිළිබඳව තව ම තොරතුරක් ලැබී නොමැත.
- රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපති ධම්මික ගංගනාත් දිසානායක මහතා සිය නිවසේ සිටිය දී පැහැරගෙන යනු ලැබූ අතර පසු දින ඔහු මුදා හැරිණි.
- වාලච්චේනෙ සිට කල්මුනේ දක්වා ධාවනය වූ මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් බසයක් නාඳුනන තුවක්කුකරුවන් පිරිසක් විසින් ගිනි තබා විනාශ කොට ඇත.
- වැල්ලවත්තේ පැහැර ගෙන යනු ලැබූ ගුරුවරියක් නැවත ඇගේ නිවස ඉදිරිපිටට ගෙන ගොස් දමා ඇත.
- ත්‍රිකුණාමලයේ සය හැවිදිරි දැරියක් පැහැර ගෙන ගොස් ඝාතනය කෙරිණි.
- වව්නියාවේ කඳවුරුවල සිටි වැඩිහිටියන් 64 දෙනෙක් සිය නෑසියන් වෙත යැවීමට කටයුතු කර තිබේ.
- මන්නාරම රෝහලින් මව්වරුන් දෙදෙනෙක් හා දරුවන් තිදෙනෙක් අතුරුදන් වී තිබේ.
- ෂෙල් ප්‍රහාරයකින් කෙයා සංවිධානයේ සේවකයෙක් මරුමුවට පත් විය.
- රුබෙල්ලා එන්නත විෂ වීමෙන් මාතර ප්‍රදේශයේ දැරියක් මිය ගිය අතර 26 දෙනෙක් රෝහල් ගත කර තිබේ.
- මඩකලපුව දිස්ත්‍රික්කයේ දී ටීඑම්වීපී සාමාජිකයන් දෙදෙනෙක් වෙඩි තබා ඝාතනය කෙරිණි.

**අත්අඩංගුවට ගැනීම් හා පැහැරගෙන යාම්**
අදාළ කාල සීමාව තුළ සෝදිසි මෙහෙයුම් තුළින් සැකකරුවන් 275 දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇත. කිසියම් ස්ථානයක රැඳී සිටීමට හේතු පැහැදිලි කිරීමට අපොහොසත් වීම හා සිය අනන්‍යතාව තහවුරු කිරීමට නොහැකි වීම නිසා මෙසේ අත් අඩංගුවට ගැනීම සිදු වී තිබේ. මේ අතරින් වැඩි ම අත් අඩංගුවට ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වන්නේ මාතර (141) දිස්ත්‍රික්කයෙනි. අකුරැස්සේ සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාරය මෙයට හේතු වූවා වන්නට පුළුවන. සිය අනන්‍යතාව තහවුරු කිරීමට අපොහොසත් වීම නිසා හා වැල්ලවත්ත ප්‍රදේශයේ රැඳී සිටීමට පිළිගත හැකි හේතු දක්විය නොහැකි වීම නිසා වැල්ලවත්ත ප්‍රදේශයේ ආරක්ෂක හමුදාව හා පොලිසිය එක්ව කරන ලද සෝදිසි මෙහෙයුමකින් 39 දෙනෙක් අත්අඩංගුවට ගෙන තිබේ.

අදාල කාල සීමාව තුළ පැහැරගෙන යාම්වලට ලක් වූ බොහෝ දෙනෙක් නැවත නිදහස් කර එවීම සිදු විය. කොළඹ දී පැහැරගෙන යනු ලැබූ 5 දෙනෙකුගෙන් 4 දෙනක් නිදහස් කරනු ලැබූහ. වව්නියවේ දෙදෙනෙක් ද පුත්තලමේ එක් අයෙක් ද නිදහස් කරනු ලැබිණි. මේ අතර මන්නාරම රෝහලේ මව්වරුන් දෙදෙනෙක් හා දරුවන් තිදෙනෙක් අතුරුදන් වී ඇත.

**ඝාතනය කිරීම් හා තුවාල සිදු කිරීම්**
දෙමළ පුවත්පත් වාර්තා කරන අන්දමට මුලතිව් දිස්ත්‍රික්කයේ සිදු වූ ෂෙල් ප්‍රහාර හා වෙඩි තැබීම්වලින් 106 දෙනෙක් මරුමුවට පත් වී 380 පමණ පිරිසක් තුවාල ලබා ඇත. අකුරැස්ස ප්‍රදේශයේ සිදු වූ මරාගෙන මැරෙන ප්‍රහාරයකින් 15 දෙනෙක් ජීවිතක්ෂයට පත් වී 40 දෙනෙක් තුවාල ලබා ඇති අතර ඉඟිනියාගල කරමැටියාව ප්‍රදේශයේ එල්ටීටීඊ සංවිධානයේ බවට සැක කෙරෙන පිරිසක් විසින් සිවිල් වැසියන් 16 දෙනෙක් ඝාතනය කර 10 දෙනෙකුට දරුණු ලෙස තුවාල සිදු කර තිබේ.

මඩකලපුව ප්‍රදේශයේ කළින් නිරීක්ෂණයට භාජනය වූ කාල සීමාව හා සසඳා බලන විට ප්‍රචණ්ඩත්වය වර්ධනය වී ඇති ආකාරය පෙනුණි. මෙම දිස්ත්‍රික්කයේ 10 දෙනෙක් වෙඩි තබා ඝාතනය කරනු ලැබිණි.

(hrac1@cha.lk ඔස්සේ මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබා ගත හැකිය.)

# ආර්ථික සන්දර්භය

**මා**ර්තු මාසයේ ආර්ථික සම්බන්ධයෙන් ව යහපත් ප්‍රවෘත්තිය සේ පසුගිය මාසයේ 7.6ක් වූ උද්ධමනය මේ මාසය වන විට 5.3 දක්වා පහත බැස තිබීම දැක්විය හැකිය. ශ්‍රී ලාංකික බැංකු දෙකක් වන හැටන් නැෂනල් බැංකුව හා ඩීඑෆ්සීසී බැංකුව, වසරේ බැංකුව අභිෂේක කිරීමේ FT/IFC තිරසාර බැංකුකරණය පිළිබඳ තරගාවලියට ඇතුළු වී ඇති බැංකු 22 අතර ට එකතු වී ඇති බව ලන්ඩනයේ ෆයිනෑන්ෂල් ටයිම්ස් නිවේදනය කළේය. මෙය ශ්‍රී ලංකා බැංකුකරණය ඇගයීමට ලක් වීමක් වේ.

LMD නිල්සන් ව්‍යාපාර විශ්වාසනීයත්වය පිළිබඳ දර්ශකය මගින් පෙන් වා දුන් ආකාරය එම දර්ශකය පෙබරවාරි මාසයේ දී 122 අගයක් ගත් අතර මෙය වසර දෙකකින් දක්වූ උපරිම අගය වේ. ජනවාරි මාසයේ දී මෙම අගය 96ක් විය. මෙම තත්වය ඇති වීමට හේතුව යුද්ධයේ නිමා වීමක් අත ළඟ පෙනෙන නිසා බව සිතිය හැකි අතර මෙම විශ්වාසනීයත්වය දීර්ඝ කාලීන වනු ඇත් දැයි සැක සහිතය.

මාර්තු මාසය තුළ රාජ්‍ය මූල්‍ය තත්ත්වය දැඩි විය. රජයේ විශ්‍රාමිකයන්ගේ වැටුප් අක්‍රමිකතා දුරු කිරීමට අවශ්‍ය රුපියල් බිලියන 15 දැනට සතු නොවන බව රජය පිළිගෙන ඇත. ඇමරිකානු ඩොලර් බිලියනයක ඉරාන ණය ආධාර සහිතව සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අතරමග ඇන හිට ඇත්තේ ඒ සඳහා ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් අවශ්‍යවන ඩොලර් මිලියන 350 සොයා ගැනීම දුෂ්කර වී ඇති නිසාය. කෙසේ වෙතත් මිහින් එයා ආයතනයේ බැංකු ණයක් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 400ක් අනුමත වී තිබුණි.

භාණ්ඩාගාර බිල්පත්වල දැන් පවතින සීමාව වන රුපියල් මිලියන 600, රුපියල් මිලියන 750 දක්වා වැඩි කර ගැනීමට රජයේ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටියි.

පසුගිය වසරේ ජනවාරි හා පෙබරවාරි මාසයන් සමග සසඳද්දී 2009 වර්ෂයේ අදාළ මාසවල සංචාරක ආගමනය 25.5%කින් පහළ බැස තිබුණි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනයන් අර්බුදයට ලක් වීමේ එක් හේතුවක් සේ ගෝලීය ආර්ථික අර්බුදය පවතියි. දිස්ත්‍රික්ක හතක ඇඟලුම් කම්හල් සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයකින් අනාවරණය වූයේ 2005 මැද භාගයේ සිටි 2009 මුල භාගය දක්වා කාලය තුළ ඇඟලුම් කම්හල් 75 පමණ වැසී ගොස් ඇති බවයි. ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන ඇඟලුම් මිලදී ගන්නන් සංඛ්‍යාව 2005 වර්ෂයේ දී 50 ක් වූ අතර මේ වන විට එය 30 දක්වා පහත බැස තිබේ. ගෝලීය ආර්ථික අර්බුදය අපනයනයන් අර්බුදයට ලක්වීමට එක් හේතුවක් පමණක් වන අතර සෙසු හේතූන් අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, අයහපත් ආරක්ෂක තත්ත්වය හා රුපියල අධි ප්‍රමාණ වීම දැක්විය හැකිය.

දකුණු ඉන්දියාවේ කෙන්යාවේ හා ශ්‍රී ලංකාවේ ඇති වී ඇති නියං තත්ත්වය නිසා ලෝක වෙළඳපළේ තේ සැපයීම පහත බැස ඇති අතර මේ නිසා මිල යම් ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. තව දුරටත් සලකා බලන විට පෙනී යන්නේ ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ශ්‍රම ඵලදායීතාව ඉන්දියාවේ ශ්‍රම ඵලදායීතාවෙන් තුනෙන් දෙකක් පමණත් කෙන්යාවේ ශ්‍රම ඵලදායීතාවෙන් 55% පමණත් වන බවයි. මේ අයහපත් සාධක නිසා ශ්‍රී ලංකා තේ වලට ඊජිප්තු, පකිස්ථාන, එක්සත් රාජධානි හා ඇෆ්ගනිස්ථාන් තේ වෙළඳපළ අහිමි වී ඇති බවයි. කෙන්යාව මේ වෙළඳපළ සියතට ගෙන ඇත. රුපියල අධි ප්‍රමාණ වීම නිසා අපගේ තේ තවත් අඩු තරගකාරීත්වයකට පත්වේ.

ඉන්දියාව සමග අවබෝධතා ආර්ථික සහයෝගීත්වයක් (CEPA) ඇති කර ගැනීමට රජය දරන උත්සාහයට විරෝධය දක්වමින් ව්‍යාපාරික ප්‍රජාව පවසන්නේ මෙසේ සිදු වුව හොත් ඉන්දියාව ශ්‍රී ලාංකික අපනයනවලට බදු නොපනවනු ඇති බවයි.

එල් පී ගෑස් මත පනවා තිබූ ආනයන බද්ද අහෝසි කිරීමට රජය විසින් කටයුතු කර ඇත. මෙමගින් සෙරමික් අපයනය කරුවන් වැනි කාර්මික කටයුතුවල දී ගෑස් භාවිත කරන පිරිසට සහනයක් සැලසෙනු ඇත.

අපනයන නියෝග අඩු වී ඇති පාලක සමාගම්වල වැඩකරන සතිය සීමා කිරීම මගින් සේවකයින් තාවකාලිකව ඉවත් කිරීමට පාලකයන් ගේ සංගමය විසින් කරන ලද ඉල්ලීමට රජය නිල වශයෙන් ප්‍රතිචාර දක්වා නොමැත.

මාර්තු මාසයේ මැද භාගයේ දී කල් පිරුණු ඩොලර් මිලියන 215 බැඳුම්කරයක් ගෙවීම සඳහා ශ්‍රී ලංකාව විසින් ඩොලර් මිලියන 185ක ද්වී වාර්ෂික ඩොලරයේ අගය මත පදනම් වන ප්‍රිමියම් පොලී අනුපාතිකයක් සහිත බැඳුම්කරයක් උපයා ගැනීමට සමත් වී තිබේ.

මාර්තු මාසය අග භාගයවන විට මහ බැංකුව සතු වූ දළ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන නවසීයක් විය. මේ හේතුව නිසා අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙන් ස්ථාවර ණයක් ඉල්ලීමට රජයට සිදු විය. මෙම ණය ලබා දෙනු ඇත්තේ රුපියල අවප්‍රමාණ කිරීම, රජයේ රැකියාවලට බඳවා ගැනීම අත්හිටවීම, අයවැය හිඟය පියවීම යන කොන්දේසි මතය. කෙසේ වෙතත් අයවැය හිඟය පියවීම සිදු විය යුතු වැදගත් කාර්යයකි.

# පරිසරය



පෙබරවාරි මාසයේ සිට මාර්තු මුල් භාගය දක්වා පැවති නියං තත්ත්වය නිසා කෘෂි කාර්මික ක්ෂේත්‍රයට දැඩි අයහපත් බලපෑම් ඇති වූ අතර මේ හේතුව නිසා බොහෝ ගොවීන්ට සිය වගා සියල්ලම හෝ ඒවායින් කොටසක් අහිමි වී යාම සිදු විය. මෙම තත්ත්වය අනුරාධපුරය හා කතරගම වැනි ප්‍රදේශයන්ට මෙන් ම තේ වගා කරන කඳුකරයට ද බලපෑ නිසා තේ නිෂ්පාදනය තුනෙන් එකක් ප්‍රමාණයකින් අඩු වීමක් පෙන්නුම් කළේය. මෑත සති කිහිපය තුළ යලි කාලගුණ තත්ත්වය යහපත් වූ නිසා කිසියම් සහනයක් අපේක්ෂා කල හැකි වනු ඇත.

වැසි සහිත කාලගුණය ආරම්භ වී ඇතත් ජලාශවල ජල මට්ටම් තවමත් පහළ මට්ටමක පවතියි. මෙසේ ජල මට්ටම පහත යෑම හේතුවෙන් වික්ටෝරියා හා මස්කෙලිය ජලාශයන් තැනීමේ දී යටවූ තෙල්දෙණිය හා මස්කෙළිය නගර යලි මතු වී තිබේ. මාර්තු මස 9 වැනිදා හා 10 වැනිදා ඇති වූ අධික වැසි හේතුවෙන් උතුරු ප්‍රදේශයේ ගංවතුර තත්ත්වයන් ඇති වී ඇති අතර මේ හේතුවෙන් අභ්‍යන්තර අවතැන් වූවන් දැඩි සේ පීඩාවට පත් වී සියටියි. බෙහොමයක් පවුල් වතුරින් වටවූ දිවයින් වලට කොටු වී සිටිනු දැකිය හැකි විය. වැසි සමය ආරම්භ වීමත් සමග විදුලි හා අකුණු අනතුරු ඇති වීමට ඉඩ තිබේ. මාර්තු මාසයේ අකුණු සැර වැදීමක් නිසා තේ නෙලන්නන් දෙදෙනෙක් මරණයට පත්වූ බව අසන්නට ලැබිණි.

මහනගර සභාවන්ට අයත් බිම් ප්‍රදේශවල විශාල වශයෙන් කුණු කඳු එකතු වීමට නව පිළියමක් යෝජනා විය. මහ නගර සභාවන් විසින් කුණු බැහර කරනු ලබන භූමි නිසියාකාරව පිරිසිදු නොකරන්නේ නම් එම බිම් කොටස් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යංශයට පවරා ගත හැකිවන පරිද්දෙන් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යංශය කැබිනට් අනුමැතියක් ලබා ගෙන ඇත. ඉන්පසු මේ කුණු හැකි තරම් දුරට ප්‍රතිචක්‍රීකරණය කිරීමට කටයුතු සිදු කෙරෙනු ඇත. කුණු බැහැර කිරීම හා සම්බන්ධ තවත් කරුණක් සේ රජය මගින් මාර්තු මස මුල් භාගයේ දී ජංගම දුරකථන වෙනුවෙන් බද්දක් පැනවීම දැක්විය හැකිය. මෙයට හේතුව ශයෙන් දක්වා අත්තේ වාර්ෂිකව ජංගම දුරකතක බැටරි මිලියන දාසයක් පමණ කසලවලට එක්වන බවයි.

වන්නි ප්‍රදේශයෙ අභ්‍යන්තර අවතැන් වූවන් ට නිවාස අවශ්‍ය වේ. මේ නිසා තාවකාලික නිවාස හා කූඩාරම් තැනීම සඳහා වනාත්තර බිම් විශාල වශයෙන් එළි කිරීම සිදු වේ. මෙසේ කඳවුරු බිම් එක එල්ලේ අනතුරුවලට නිරාවරණය වීම නිසා ගංවතුරින් හා අධික උෂ්ණත්වයෙන් පීඩා සිදු වීම වැඩි වී ඇත. ගස් ඉවත් කිරීම හා බර යන්ත්‍ර භාවිතය නිසා පස් තට්ටුවට හානි වී තිබීම පරිසරයට, ප්‍රදේශයට මෙන් ම එහි සිටින ජනතාවට ද බලපෑම් ඇති කරනු ඇත.

# සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය



යුද ජයග්‍රහණ නිසා රජය අපේක්ෂා නොකළ අන්දමින් ශක්තිමක් වී ඇති අතර මෙය විපක්ෂය දුර්වල කිරීමට හේතු වී තිබේ. මේ අවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සැලකීමක් නොකරමින් පාලනයේ දැඩි හස්තයෙන් රට මිරිකා ගැනීමට මනා අවස්ථාවකි. මෙය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වන ජනතා ව්‍යාපාරයේ අත් පත්‍රිකාවකින් උපුටා ගෙන ඇත. මෙම පත්‍රිකාව දේශපාලන ක්‍රියාකාරී ජනාධිපති උපදේශක වාසුදේව නානායක්කාරගේ අත්සනින් යුතුව මාර්තු 12 වෙනි දා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වන ජනතා ව්‍යාපාරයක් තැනීම සඳහා පැවති මූලික සංවාදයක දී බෙදා හරින ලදි. මෙය යහපත් අධිටනින් යුත් උගතුන් පිරසක් හා සෙසු ක්‍රියාකාරීන් විසින් ගන්නා ලද නිර්භීත ක්‍රියාමාර්ගයක් සේ සැලකිය හැකිය. මෙය අවිනිශ්චිත අනාගතය දෙස සංවාදශීලී ලෙස බැලීමේ යහපත් ක්‍රියාමාර්ගයක් වේ.

සියලුම ප්‍රජාවන්ට තමාගේ පසුගිය මෝඩකම් දෙස නැවත හැරී බලමින් ඔවුනොවුන්ගේ ප්‍රිස්ම තුළින් ඈත පායා එන දේදුන්නේ වෛවර්ණත්වය දැකීමට මෙමගින් අවස්ථා සැලසෙනු ඇත. මෙහිදී පෙන්වා දුන් කාරණයක් වන්නේ එල්ටීටීඊ සංවිධානය පරදවා ජයග්‍රහණය ලැබීම තව දුරටත් වර්ගවාදය ඇති කිරීමට හේතු වන්නේ කෙසේ ද යන්නයි. කෙසේ වෙතත් මෙහි අවසානය විසඳිය නොහැකි ගැටලුවක් සේ පවතිනු ඇත. වාසුදේව නානායක්කාර මහතාගේ ප්‍රකාශයෙන් අදහස් වන්නේ සිවිල් සමාජයේ ඇති වී ඇති මේ උභතෝකෝටිකය විසඳීමට පියවරක් ගත යුතු බවයි. ත්‍රස්තවාදය පරාජය කිරීමේ මූලික අරමුණ වන්නේ කුමක්ද? මෙය ප්‍රචන්ඩත්වයෙන් තොර නීති ගරුක සමාජයක් බිහි කිරීමේ එක් පියවරක් ද? එසේත් නැත්නම් එය ප්‍රචන්ඩත්වය නිසා පීඩා විඳින බහුතර ජනතාවක් ෂතුටට පත් කිරීම සඳහා ගත් හුදෙක් දේශපාලන අරමුණක් පමණක් ඇති දෙයක්ද? එය පසුව කී කාරණය නම් වාර්ගික බෙදීම් වලක්වා ගැනීමට සිවිල් සමාජය වඩාත් සක්‍රිය අයුරින් දායක විය යුතුය.

කෙසේ වෙතත් වාසුදේව නානායක්කාර රජය ශක්තිමත් වීම හා ඊට සමගාමීව විපක්ෂය දුර්වල වීම සේ විස්තර කර ඇති කාරණය ආචාර්ය දයාන් ජයතිලක වෙනස් ආකාරයකින් විශ්ලේෂණය කරයි.

ආචාර්ය දයාන් ජයතිලක සඳහන් කරන්නේ, "… *මෙම ශක්තිය ලැබී ඇත්තේ ජනතා සහයෝගීත්වය නිසාය. මෙම ජනප්‍රියත්වය 75 පමණ අඩු ප්‍රමාණයක සිට 83-93 දක්වා පමණ ප්‍රමාණයකින් යුක්ත වේ. මෙම හමුදා සාර්ථකත්වය සඳහා පදනම් වී ඇත්තේ, විශේෂයෙන් ම සිංහල ජනතාව වන නමුත් සිංහල ජනතාව පමණක් නොවේ. මෙමගින් අනාවරණය වනුයේ ජනතාව, ආරක්ෂක හමුදා හා දේශපාලන නායකත්වය අතර පවතින් අත්‍යවශ්‍ය හා නොබිඳිය හැකි සබඳතාවයි. මෙසේ සමාජය හා රාජ්‍යය අතර ඇති වී ඇති සබඳතාව ඓතිහාසික වශයෙන් කලාතුරකින් ඇතිවන්නක් සේ සැලකිය හැකිය. පළමුවරට මේ කාරණයේ දී ජනතාවට සවන් දෙන නායකත්වයක් අපට හිමි ව තිබේ. මේ කාරණය ජනතා කැමත්තට පණ ලැබීමක් සේ දැක්විය හැකිය. මෙය 2008 වසරේ ලද ජයග්‍රහණයක් සේ සැලකිය හැකි අතර මේ වසරේ සුවිශේෂ ලක්ෂණයක් ද වේ* ".

ආචාර්ය දයාන් ජයතිලක *ඓතිහාසික වශයෙන් කලාතුරකින් ඇතිවන්නක්* සේ දක්වා ඇති සබඳතාව වාසුදේව නානායක්කාර වෙනත් ආකාරයකින් දකියි.

යුද පුවත් කාර්යක්ෂම ලෙස වාර්තා කිරීමට අමතර ව මාධ්‍ය තවත් කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කර තිබේ. මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය විසින් තමා කෙරහි පනවා ගනිමින් තිබූ ස්වයං වාරණ කිසියම් දුරකට ලිහිල් කරමින් ආර්ථිකයේ අර්බුදකාරී තත්ත්වය, මූල්‍ය ආයතන කිහිපයක බිඳ වැටීම මනා රාජ්‍ය සේවයක් පිහිටුවීම ආදී කරුණු කෙරෙහි ද අවධානය යොමු කර ඇති ආකාරය පෙණුනි.

# මානුෂික හා සංවර්ධන අවකාශය



**උතුර**

2006 අගොස්තු මාසයේ දී A-9 මාර්ගය වසා දැමීමෙන් පසු පළමු වරට 2009 මාර්තු මස 10 වැනිදා හමුදා ආරක්ෂාව සහිතව ආහාර ලොරි 22ක් යාපනයට යැවිණි. ලොරි ආපසු කොළඹට පැමිණෙන විට යාපනයේ සිට එළවළු හා කරවල ගෙනැවිත් තිබුණි.

මාර්තු 16 වැනිදා වන විට වන්නි ප්‍රදේශයේ සිට පුද්ගලයින් 3539 යාපනයට පැමිණ තිබුණි. වන්නියේ සිට පැමිණෙන අභ්‍යන්තර අවතැන්වූවන්ට කඳවුරු 6ක නවාතැන් පහසුකම් සපයා ඇත.
කෝපායි ගුරු පුහුණු විද්‍යාලය - අභ්‍යන්තර අවතැන් වූවන් 463
පැරණි අධිකරණ ශාලාව යාපනය - අභ්‍යන්තර අවතැන් වූවන් 113
මුරසුවිල් RCTMS පල්ලිය - අභ්‍යන්තර අවතැන් වූවන් 1313
කොඩිකාමම් GTMS පාසැල - අභ්‍යන්තර අවතැන් වූවන් 706
කයිතඩි හින්දු ළමා නිවස - අභ්‍යන්තර අවතැන් වූවන් 184
කයිතඩි විශ්වවිද්‍යාල නේවාසිකාගාරය - අභ්‍යන්තර අවතැන් වූවන් 760

UNCHR,UNICEF,WPF හා ජාත්‍යන්තර රතුකුරුස සමාජය යන ආයතනවලට මේ කඳවුරු වෙත ළඟා වීමේ හැකියාව ඇත. අභ්‍යන්තර අවතැන් වූවන් ට සහන සැපයීම සඳහා විවිධ උපකරණ ලබා දීමට සමහර රාජ්‍ය නොවන සංවිධානවලට අවස්ථාව ලබා දී ඇත. දිගින් දිගටම පැමිණෙන වූවන්ට නවාතැන් පහසුකම් සැපයීම සඳහා නව ස්ථාන දෙකක් හඳුනාගෙන ඇති අතර දැනට පවතින නවාතැන් තව දුරටත් පුළුල් කිරීමේ කටයුතු ද සිදු වේ. දිනෙන් දින තුවාලකරුවන් සංඛ්‍යාව ඉහළ යන හෙයින් මේ අය ට වෛද්‍යාධාර සැපයීම සඳහා පුල්මුඩෙ ප්‍රදේශයේ රෝහලක් ස්ථාපනය කර ඇත. ත්‍රිකුණාමලය හා වව්නියාව රෝහල්වලට පමණක් දිනෙන් දින ඉහල යන තුවාල කරුවන්ට ප්‍රතිකාර සිදු කළ නොහැකි වේ. ශ්‍රී ලංකා රජයේ සහයෝගය ඇතිව විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත රෝහලක් ස්ථාපනය කර ඇත. මාර්තු 29 වැනිදා වන විට ත්‍රිකුණාමලය රජයේ රෝහලේ රෝගීන් 177 ක් ද සෙසු රෝහල්වල රෝගීන් 1210ක් ද සිටින බව වාර්තා වී තිබේ. දැනට පුල්මඩෙ ස්ථාපනය කරන ලද ක්ෂේත්‍ර රෝහලේ රෝගීන් 37 ප්‍රතිකාර ලබන අතර සෙසු පිරිස පාණ්ඩවිය මූලික රෝහලට හා පුල්මුඩෙ රෝහලට මාරුකර යවා ඇත.

ගැටුම්කාරී තත්ත්වය උග්‍ර වෙමින් පවතින අතර එල්ටීටීඊයේ පාලන බලය ක්ෂය වෙමින්

පවතිද්දී ගැටුම් පවතින කලාපයේ සිට ගොඩබිම් මාර්ගවලින් හා මුහුදු මාර්ගවලින් ජනතාව විශාල වශයෙන් රජයේ පාලන ප්‍රදේශවලට පැමිණෙමින් සිටිති. මාර්තු 22 වන විට වව්නියාවේ පවුල් 13479කට අයත් පුද්ගලයින් 41118 දෙනෙක් වූහ. ඔවුහු වව්නියාවේ සුභ සාධන කඳවුරු 13 හා සහන ගම්මාන දෙකක වෙසෙති. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ අත්සනින් යුතුව නිකුත් කරන ලද ලිපියකින් රාජ්‍ය නොවන සංවිධාන වැඩි ප්‍රමාණයකට ප්‍රදේශයට ඇතුලු වීමට ඉඩකඩ ලබා දී ඇත.

මැනික්ෆාම් කඳවුරේ ජල ගැටලුව ප්‍රබල ලෙස පවතියි. භූගත ජලය පමණක් කිසිසේත් ම ප්‍රමාණවත් නොවේ. මෙයට විකල්පයක් වන්නේ ජල නල ස්ථාපනය කිරීමයි. එහෙත් මෙය ස්ථිර කාර්යයක් වන නිසා නියෝජිත ආයතන මගින් මෙයට සහයෝගය දක්වනු ඇතැයි සිතිය නොහැක. තවත් විකල්පයක් වන්නේ මහවැලි ගඟෙන් වතුර ලබා ගැනීමයි. එහෙත් මෙහි ප්‍රතිඵලයක් ලෙස වගාවන්ට කිසියම් හානියක් සිදු වුව හොත් ගොවීන්ට වන්දි ගෙවීමට සිදු වනු ඇත.

UNDP බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාකාරීන් වාර්තා කරන ලද අන්දමට රජයේ ක්‍රියාකාරීන්ගේ මැදිහත් වීම නිසා මුසාලි/සීලාවතුරෙ ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කිරීමෙ කටයුතු කඩිනම් වී ඇත. මීට අමතරව මඩු ප්‍රදේශයේ, රයිස් බෝල් ප්‍රදේශයේ හා A-32 මාර්ගයේ මීටර් 25 පුරාවට මාර්ගය දෙපස බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සිදු කළ යුතු වේ. මාන්තෙයි උතුරු ප්‍රදේශයේ ද බිම් බෝම්බ ඉවත් කිරීම සිදු කළ යුතු අතර මන්නාරමේ දිසා ලේකම් කොට්ඨාශ තුන ක ද බිම් බෝම්බ ඉවත් කළ යුතු ප්‍රදේශ හඳුනාගෙන ඇත. මන්නාරම සඳහා හඳුනාගෙන ඇති මුළු ක්ෂේත්‍ර සංඛ්‍යාව 37ක් වේ.

**නැගෙනහිර**

**ත්‍රිකුණාමලයේ** අභ්‍යන්තර අවතැන්වූවන් - පවුල් 1176 පුද්ගලයින් 3829

ත්‍රිකුණාමලයේ පවුල් 147ක් පට්ටලිපුරම් හි නැවත පදිංචි කරවා ඇති අතර කුඩාරම් 120 ඔවුන් වෙනුවෙන් ඉදිකර ඇත. ගැඹුරු ළිං මගින් ජලය සැපයීම සිදු කර තිබේ. නල ළිං සකස් කිරීම සඳහා UMCOR සහයෝගය ලැබී ඇත. නැවත පදිංචි කිරීම සම්පන්ධයෙන් ෂලකා බලන විට ඉරාන රජය මගින් නිවාද 150 සෑදීමට නියමිතය. මොරවැව ප්‍රදේශයේ නැවත පදිංචි කරවීමේ පහසුකම් ඉල්ලා සිටිමින් අයදුම් පත් 150 ඉදිරිපත් වී තිබේ. මේ අයට ආධාර ලබා දීමට පෙර ඔවුන්ගේ සැබෑ තත්ත්වය අදාළ රජයේ නියෝජිතයින් හරහා සොයා බැලීම වැදගත් ය.

**මඩකලපුව** අභ්‍යන්තර අවතැන්වූවන් - පවුල් 2110 පුද්ගලයින් 8001

**අම්පාර** අභ්‍යන්තර අවතැන්වූවන් - පවුල් 1078 පුද්ගලයින් 3961

මඩකලපු දිස්ත්‍රික්කයේ කිරාන් දිසා ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් තුනක නැවත පදිංචි කරවීමේ කටයුතු සිදු කිරීමේ කටයුතු ආරක්ෂක මෙහෙයුම් නිසා නතර වී ඇත. බෝවන රෝග පැතිරීමේ අවදානමක් ඇති බව පෙනී යන අතර මේ දක්වා පණු හොරි රෝගීන් 25 දෙනෙක් වාර්තා ඇතත් පවුල් නැවත එක් කිරීම හා අවදානම් සහිත කණ්ඩායම්වලට විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කිරීම වැදගත් වේ.

**සාමාන්‍ය කරුණු**

එල්ටීටීඊ සංවිධානය විසින් දරුවන් බඳවා ගැනීමට වැලක්වීමේ අරමුණෙන් ළමයින් ආපසු නමින් ජාතික ව්‍යාපාරයක් රජය විසින් දියත් කර ඇත. කලින් ළමා සොල්දාදුවන් නිදහස් කිරීම සඳහා වූ ගිවිසුමක් ඇති කර ගැනීම නිශ්ඵල වූ කල්හි ළමා සොල්දාදුවන් බඳවා ගැනීම වැලැක්වීමේ අරමුණ පෙරදැරිව මෙය ආරම්භ කර තිබේ. 2008 දෙසැම්බර් මාසය වන විට එල්ටීටීඊ සංවිධානය විසින් බඳවා ගෙන තිබූ වයස අවුරුදු 18 ට අඩු දරුවන් ගණන 6288 විය. මේ අතරින් 3809 පිරිමි දරුවන් වූ අතර 2478ක් ගැහැණු දරුවන් විය. මේ දරුවෝ සිය පවුල්වලින්, පාසැලෙන් හෝ ප්‍රජාවෙන් බලෙන් රැගෙන ආ අය වෙති. රටේ සෙසු දරුවන් අත් විඳින ප්‍රතිලාභ මේ දරුවන්ට අහිමි වී තිබේ. ඔවුන් දිගින් දිගටම ප්‍රචණ්ඩත්වයෙන් පිරි පරිසරයක ජීවත් වී ඇති අතර ඔවුන් ට සාමකාමී සාමාන්‍ය පරිසරයක් ලබා දීම වැදගත් වේ.

## බාහිර ක්‍රියාකාරීන්

ශ්‍රී ලංකාව කෙරෙහි දක්නට ඇති මැදිහත් වීම් ඒ ආකාරයෙන් මිස වෙනත් කිසිම ආකාරයකින් දකිය හැකි නොවේ. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල සමාජික ජෝන් හෝම්ස් ගේ පහත දක්වෙන ප්‍රකාශයෙන් එය මනාව පැහැදිලි වේ.

*“ජනාධිපතිතුමනි, විවිධ පාර්ශව හරහා සිවිල් වැසියන් මුදා හැර ඔවුන්ට යාමට ඉඩ සලසන සේ එල්ටීටීඊ සංවිධානය වෙත කෙරෙන ඉල්ලීම් දිගින් දිගටම සිදුවන බව අප දන සිටිමු. මේ ප්‍රයත්නයන් ඉක්මණින් සාර්ථක වේවා යැයි මම ප්‍රාර්ථනා කරමි. එසේම සිවිල් වැසියන්ට පැමිණීමට ඉඩ කඩ සලසමින් අවසාන සටන මඳක් පමා කිරීම සුදුසු බව අපගේ හැඟීමයි.*

*ජනාධිපතිතුමනි, 2009 වර්ෂය සඳහා වන පොදු මානුෂීය ක්‍රියාකාරී සැලැස්ම (CHAP) පෙබරවාරි 18 වන දින ආරම්භ කරන ලදි. මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 155 ක් වෙන් කර ඇත. රාජ්‍ය නොවන සංවිධාන හා එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවලට ඒකාබද්ධව සහනසේවා අවශ්‍යතා වෙනුවෙන් යොදා ගැනීම සඳහා මා විසින් මධ්‍යම හදිසි අවස්ථා ප්‍රතිචාර අරමුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 10 ක මුදලක් මුදා හරිනු ලැබ ඇත. මෙම මුදල් ජීවිතාරක්ෂක කටයුතු, ආහාර, පෝෂණය, සෞඛ්‍ය, නිවාස, ජලය හා සනීපාරක්ෂාව හා හදිසි අධ්‍යාපන කටයුතු සඳහා වෙන් වේ. CHAP වෙනුවෙන් සහාය දක්වන මෙන් මම ආධාර සපයන පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිමි. අනාගය ඇත්තේ අවදානම් සහිත තත්ත්වයකය.*

*ජනාධිපතිතුමනි, දිගින් දිගටම පවතිව සටන් හමුවේ ඇතිවන මානුෂීය අර්බුද පිළිබඳ අන්තර්ජාතික ප්‍රජාවගේ අවධානය යොමු වී ඇති අතර මගේ පැමිණීම ඒ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා විය. සිවිල් වැසියන් ආරක්ෂා කිරීමට මා විසින් කරන ලද නැසු කන්ව යන ඉල්ලීමක් බවට පත් නොවනු ඇති බව මම උදක් ම විශ්වාස කරමි. මෙ කාර්යයෙහි ලා අන්තර්ජාතික ප්‍රජාව ගේ අවධාන දිගින් දිගටම යොමු වනු ඇත. එල්ටීටීඊ සංවිධානයට බලපෑම් කල හැකි සියලු පාර්ශවවලින් මා ඉල්ලා සිටින්නේ සිවිල් වැසියන් නිදහස් කිරීමට එල්ටීටීඊ සංවිධානයට බලපෑම් කරන ලෙසයි. තවත් ලත වෙමින් සිටීමට කාලයක් නොවේ”.*

# දිස්ත්‍රික්ක විශ්ලේෂණ - 2009 පෙබරවාරි 28 - 2009 මාර්තු 28

## අම්පාර

**ව්‍යුහයන්**

අම්පාර දිස්ත්‍රික්කයේ පැරා මිලිටරි ක්‍රියාකාරකම් වැඩි දියුණු වී ඇති ආකාරයක් පෙනේ. ඉඟිනියාගල කරමැටියාව, උහන, සොරිකල්මුනෙයි, සමන්තුරෙයි හා ඒ අවට ගම්මානවල සිදු වූ සිදුවීම් නිසා දිස්ත්‍රික්කය තුළ නොසන්සුන් බව වර්ධනය වී තිබේ. එසේම සොරකම්, කඩ සාප්පු බිඳීම්, හා පැහැරගෙන යාම් ආදියේ වර්ධනයක් දකිය හැකි වීම නිසා නොසන්සුන් බව තවත් වැඩි දියුණු වී ඇත. මේ අතර බරන්නරතුව ප්‍රදේශයේ තිබී ටී56 තුවක්කු කිහිපයක් හමු වී ඇති අතර දෙමළ තරුණයක් කිහිප දෙනෙක් අත් අඩංගුවට ගෙන ඇත.

ටීඑම්වීපී නායකත්වය තුළ තිබූ උණුසුම් තත්ත්වයන් එහි නායක කරුණා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් වීමත් සමග කිසියම් දුරකට සමනය වී ඇති ආකාරය පෙනේ. මේ සිදු වීමෙන් පසු දිස්ත්‍රික්කය තුළ කිසියම් අපේක්ෂා සහගත තත්වයක් ඇති වී ඇති අතර මේ නිසා ම රජයේ අවධානය ද වැඩි වශයෙන් නැගෙනහිර පළාතට යොමුවනු ඇත.

මැතක සිට දිස්ත්‍රික්කය තුළ දේශපාලන පරිසරය හා අන්තර් ප්‍රජා සබඳතාවල කිසියම් ආකාරයක වැඩි දියුණු වීමක් දකිය හැකි වේ. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන කටයුතු දිගටම සිදු වෙමින් පවතියි. විශේෂයෙන් ම මහා මාර්ග හා වාරි මාර්ග සම්බන්ධයෙන් සංවර්ධන කටයුතු සිදු වෙමින් පවතින අතර ඒ සඳහා ජනතා සහයෝගීත්වය ද මනාව ලැබෙමින් තිබෙයි.

**ක්‍රියාකාරීන්**

රජයේ ආරක්ෂක අංශ, කරුණා, නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හා ප්‍රාදේශීය දේශපාලඥයින් දනට පවතින සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සැලකිය හැකි වේ.

**ක්‍රියාත්මක වන ආකාරය**

ශ්‍රීලංකා නිදහස් පක්ෂයට එක් වීමට කරුණා විසින් ගන්නා ලද තීරණය නිසා දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ආකාරයට විශාල බලපෑමක් ඇති ව තිබේ. ටීඑම්වීපී පක්ෂයෙන් ඔහු ඉවත් වීම නිසා පක්ෂය තුළතිබූනොසන්සුන්කාරී බව කිසියම් දුරකට අඩු වී ඇති ආකාරය පෙනේ. නැගෙනහිර පළාතේ දේශපාලනය තුළ දේශපාලකයකුට කෙතරම් දුරට ක්‍රියාකාරී විය හැකිද යන්න මේ තුළින් පැහැදිලි වේ. ප්‍රදේශයේ අවශ්‍යතා වෙනුවෙන් තමාට හැකි තරම් අවධානයක් යොමු කරන බව කරුණා පවසන අතර මේ පොර පිටිය තුළ සෙසු දේශපාලකයින් හා ආරක්ෂක අංශ වේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

දිස්ත්‍රික්කය තුළ පවත්නා ස්ථාවරත්වය දිගින් දිගට ම පවත්වාගෙන යාමට රජය විසින් කටයුතු කළ යුතු වේ. පැරා මිලිටරි ක්‍රියාකාරකම් දිස්ත්‍රික්කය තුළ කිසියම් නොසන්සුන්කාරී බවක් ඇති කිරීමට හේතු වී තිබේ. දිස්ත්‍රික්කය තුළ සාමය පවත්වා ගැනීමට නම් අරමුදල් රැකියා හා සෙසු සම්පත් විවිධ ප්‍රජාවන් අතර සමාන ලෙස බෙදා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ.

## මඩකලපුව

**ව්‍යූහයන්**
අදාළ කාල සීමාව තුළ පැරා මිලිටරි ක්‍රියාකාරකම් කිහිපයක් හා ආරක්ෂ අංශ හා පැරා මිලිටරි කණ්ඩායම් අතර ගැටුම් වාර්තා වී තිබේ. කෙසේ වෙතත් දිස්ත්‍රික්කයේ සමස්තයක් වශයෙන් ආරක්ෂක තත්ත්වය වැඩි දියුණු වී ඇති ආකාරය පෙනේ. පැහැරගෙන යාම් හා ඝාතනය කිරීම් සංඛ්‍යාව පහළ ගොස් ඇත.

දිස්ත්‍රික්කයේ ජනතාවගේ වැඩි අවධානය ටීඑම්වීපී පක්ෂයේ සිදු වූ බලය හුවමාරු වීම් දෙස යොමු වී ඇති ආකාරය පෙනේ. ටීඑම්වීපී නායක කරුණා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක් වීම හා මේ අනුව ටීඑම්වීපී හා නායකත්වය නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාට හිමි වීම දිස්ත්‍රික්කය තුළ කතා බහට පත් වී ඇති කරුණු වේ. බොහෝ දෙනාගේ අපේක්ෂාව වන්නේ මෙසේ වීම නිසා රජයේ අවධානය තව දුරටත් නැගෙනහිර පළාත වෙත යොමු වනු ඇති බවයි. හින්දු දේවස්ථාන කිහිපයක්, නිවාස හා වානිජ ගොඩනැගිලි ආදී දිස්ත්‍රික්කය තුළ යලි ආරම්භ වූ සංවර්ධන ක්‍රියාවලි කෙමෙන් ඉදිරියට යන ආකාරය පෙනේ. යුද්ධයේ නිමාව අත ළඟ සේ පෙනෙන මේ අවස්ථා වේ දී දීර්ඝ කාලීන සාමය පිළිබඳ විශ්වාසය ගොඩනැගෙමින් පවතියි.

**ක්‍රියාකාරීන්**
ප්‍රධාන අමාත්‍ය, ටීඑම්වීපී හිටපු නායක කරුණා, රජයේ ආරක්ෂක අංශ, පැරා මිලිටරි කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මක වන ආකාරය**
හිටපු ටීඑම්වීපී නායක කරුණා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක්වීම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ආකාරයට විශේෂ බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇත. මෙසේ සිදු වීම නිසා ආධාර හා සංවර්ධන කටයුතුවල දී රජයේ විශේෂ අවධානය නැගෙනහිර පළාතට යොමු වනු ඇති බවට ජනතාව තුළ අපේක්ෂා දැල්වෙමින් තිබේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**
පසුගිය කාල සිමව තුළ පැරා මිලිටරි කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය අඩු වී ඇති අතර මෙවන් ක්‍රියාකාරකම් තව දුරටත් අඩු කිරීමට හා එවැනි කණ්ඩායම් පිලිබඳ නිසි පියවර ගැනීමට රජය හා ආරක්ෂක අංශ කටයුතු කළ යුතු වේ. මක් නිසා ද යත් එවැනි එක් ක්‍රියාවකින් පමණක් වුවත් දිස්ත්‍රික්කය තුළ භීතිය ඉහල යා හැකි බැවිනි.

සිය කටයුතු නිදහසේ කරගෙන යාම සඳහා ප්‍රාදේශීය පාලනයට වැඩි ඉඩකඩක් ලබා දිය යුතු වේ. එසේ ම දිස්ත්‍රිකකය තුළ යෝජිත සංවර්ධන ව්‍යාපෘති කරගෙන යාම සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබා දිය යුතු වේ.තව දුරටත් පැවසිය යුතු කාරණයක් වන්නේ දිස්ත්‍රික්කය තුළ සමස්ත වශයෙන් වූ සාමකාමීබව වර්ධනය කිරීමට නම් අන්තර් ප්‍රජා සම්බන්ධතා දියුණු කිරීමට බලධාරීන් විසින් පියවර ගත යුතු බවයි.

## කොළඹ

**ව්‍යූහයන්**
රූපවාහිනී හිටපු සභාපති ධම්මික ගංගානාත් දිසානායක මහතා පැහැර ගෙන ගොස් නැවත මුදා හැරීමේ සිද්ධිය හැරුණු විට කොළඹ දිස්ත්‍රක්කයේ වෙනත් සිදු වීම් වාර්තා වී නොමැත. ධම්මික ගංගානාත් දිසානායක මහතා පැහැරගෙන යාම හෝතුවෙන් නැවත මාධ්‍යවේදීන්ට තර්ජන එල්ල වී ඇති ආකාරය පැහැදිලි විය.

මේ මාසය තුළ කිසිම ආරක්ෂක සිදු වීමක් වාර්තා නොවීය. කෙසේ වෙතත් පසුගිය මාසයේ ඇති වූ එල්ටීටීඊ ගුවන් ප්‍රහාරය නිසා හා යුද්ධය දරුණු වත් ම තවත් ප්‍රහාර එල්ල වනු ඇතැයි යන බිය නිසා ජනතාව තවමත් ආතතියෙන් යුතුව සිටියි.

දිස්ත්‍රික්කය තුළ ඩෙංගු උවදුර යලි හිස ඔසවා ඇති බව තහවුරු කරමින් පසුගිය මාසය තුළ ඩෙංගු රෝගය නිසා සිදු වූ මරණ හතරක් වාර්තා විය.

ළඟ එන ප්‍රාදේශීය සභා මැතිවරණය දිස්ත්‍රික්කය තුළ එතරම් බලපෑමක් ඇති කර ඇති බවක් නොපෙනේ. ජනතාව ඒ සම්බන්ධයෙන් දක්වන්නේ සුළු උනන්දුවකි. මේ මාසය තුළ ජනතා විමුක්ති පෙරමුණේ කාර්යාල හයකට හඳුනානොගත් පිරිස් විසින් ප්‍රහාර එල්ල කර තිබේ. මේ හේතුවෙන් රජය විවේචනයට ලක් විය.

මේ අතර මොරටුවේ සිට කොළඹ නගරය දක්වා විශේෂ අර්ධ සුඛෝපභෝගී බස් සේවාවක් හඳුන්වා දෙන ලද අතර මෙහි අරමුණ වන්නේ කොළඹ නගර සීමාව තුළ වාහන තදබදය අඩු කර ගැනීමයි.

**ක්‍රියාකාරීන්**
රජය, දේශපාලන පක්ෂ හා මාධ්‍ය වත්මන් සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මක වන ආකාරය**
ළඟ එන ප්‍රාදේශීය සභා මැතිවරණය මේ අවස්ථාවේ දී දිස්ත්‍රික්කයේ ප්‍රධානත ම අවස්ථාව බවට පත් වී ඇත. කෙසේ වෙතත් ජන්ද දායකයින් ගේ පාර්ශ්වයෙන් මේ සම්බන්ධයෙන් එතරම් උනන්දුවක් නැති බව පෙනේ. මාධ්‍ය වාර්තාවලින් පෙන්වා දෙන අන්දමට යුද්ධය ළඟදීම නිමාවට පත් වනු ඇති බවට ජනතාව විශ්වාසය පළ කරති.

**ක්‍රමෝපායන් හා විකල්ප**
නිරන්තරව අවධානයෙන් සිටීමට ජනතාවට සිහිපත් කළ යුතු වේ. දැනට පවතින සාමකාමී තත්ත්වය නිසා ආරක්ෂාව යම් තාක් දුරකට ලිහිල් වී ඇති ආකාරයක් පෙනෙන අතර මේ නිසා ම භයානක සිදු වීම් ද සිදු වීමට ඉඩ තිබීම නිසා අවධානයෙන් සිටීම වැදගත් වනු ඇත.

ඩෙංගු වසංගතය මර්ධනය කිරීමෙ හි ලා සෞඛ්‍ය අමාත්‍යංශය විසින් වඩාත් කාර්යක්ෂම පියවර ගත යුතු වේ. මේ අනුව මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කළ යුතු වන අතර දිස්ත්‍රික්කය තුළ වඩාත් ම අවදානමට ලක් වී ඇති ප්‍රදේශ වලට ගොස් ඩෙංගු රෝගය වැලැක්වීමට සුදුසු පියවර ගැනීම සෞඛ්‍ය අමාත්‍යංශය කටයුතු කළ යුතු වේ.

## යාපනය

**ව්‍යූහයන්**
මුලතිව් හි එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිට සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් මුහුදු මාර්ග ඔස්සේ යාපනයට පැමිණ තිබේ. මෙසේ පලා ආ සිවිල් වැසියන් ගෙන් වැඩි පිරිසක් යාපනයේ කඳවුරුවල නවාතැන්ගෙන සිටියි. ඉදිරි කාලය තුළ තවත් අය පැමිණෙනු ඇති බව අපේක්ෂා කෙරේ.

වසර දෙකහමාරකට පසු රජය විසින් A-9 මාර්ගය නිල වශයෙන් විවෘත කර තිබේ. මුල දී මෙය උතුරු හා දකුණ අතර භාණ්ඩ හුවමාරුව සඳහා යොදා ගැනෙනු ඇත. මෙහි පළමු පියවර වශයෙන් ඕමන්තෙයි සිට යාපනය දක්වා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැගත් ලොරි හයක් යාම සිදු විය. මේවා ආපසු එන විට යාපනයෙන් මාළු හා කෘෂි කාර්මික ද්‍රව්‍ය රැගෙන ඒව සිදුවිය. මෙය යාපනයේ ජනතාවට යහපත් බලාපොරොත්තු ඇති කරවීමට හේතු වන්නේ ඔවුන්ට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි වන අතර ඔවුන්ගේ නිෂ්පාදනයන් වෙනුවෙන් දකුණේ හොඳ වෙළඳ පළක් ලබා හැකි වීම නිසාය.

රජය සඳහන් කරන අන්දමට අප්‍රේල් මාසයේ සිට මාර්ගය සිවිල් ප්‍රවාහන කටයුතු සඳහා විවෘත වනු ඇත. යාපනය වැසියන් සීමා කිරීම්වලින් තොරව දිවයිනේ සෙසු ප්‍රදේශ කරා නිදහසේ ගමන් කිරීමේ අපේක්ෂවෙන් පසු වෙති. ඕමන්තෙයි සිට යාපනය දක්වා රේල්පාර නැවත ගොඩනැගීම සඳහා අරමුදලක් පිහිටුවීමේ කාර්යය සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී තිබේ. මෙය ගොඩ නැගීම සිදු වුව හොත් අත්‍යවශ්‍ය කටයුතු වෙනුවෙන් යාපනයට යාම ඒම පහසුවනු ඇත.

දැනට දිස්ත්‍රික්කය තුළ ආරක්ෂක තත්ත්වය ශක්තිමත් කිරීමට කටයුතු සිදු වෙමින් පවතියි. උදාහරණයක් වශයෙන් උතුරේ වැදගත් ස්ථානවල පොලිස් ස්ථාන ස්ථාපනය කිරීම දැක්විය හැකිය.

**ක්‍රියාකාරීන්**
රජය, රජයේ ආරක්ෂක අංශ, එල්ටීටීඊ සංවිධානය හා අභ්‍යන්තර අවතැන්වූවන්, රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් වේ. එසේ ම අන්තර්ජාතික රතුකුරුස සමාජය අභ්‍යන්තර අවතැන් වූවන්ට සහන සපයමින් ප්‍රධාන ක්‍රියාකාරියෙක් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**
A-9 මාර්ගය විවෘත කිරීමත් සමග වෙනත් ප්‍රදේශ කරා යෑමේ හැකියාව වැඩිදියුණු වී ඇති හෙයින් ප්‍රදේශයේ ජනතාව සතුටට පත් වී සිටිති. එසේම ඕමන්තෙයි හා යාපනය අතර ඉදිකිරීමට නියමිත දුම්රිය මාර්ගය ද ජනතාව තුළ නව අපේක්ෂා දල්වා ඇත. A-9 මාර්ගය විවෘත කිරිමත් සමග අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පහල යෑම සිදු විය හැකි අතර එසේ ම භාණ්ඩ ප්‍රමාණාත්මක වශයෙන් ඉහල යෑම ද සිදු විය හැකිය. එසේම දිස්ත්‍රික්කයේ නිෂ්පාදන වලට දකුණේ හොඳ වෙළඳපළක් ලබා ගැනීමේ හැකියාවද වේ. මේ මගින් දිස්ත්‍රික්කය තුළට ආදායම ගලා ඒම නිසා එහි ධාරිතාව වැඩි දියුණු වී ජනතාව ගේ ජීවන තත්වය ඉහළ යෑම සිදු වනු ඇත.

**ක්‍රමෝපායන් හා විකල්ප**
මුලතිව් හි එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිට පලා එන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරිමට රජය පියවර ගත යුතු වේ. එසේ ම ඔවුන්ට අවශ්‍ය නිවාස, ආහාර, ඖෂධ, ඇඳුම් පැළඳුම් හා වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සපයා දෙමින් ඔවුන්ගේ සුභසාධනය සඳහා කටයුතු කිරීම ට රජය මෙන් ම සහන සේවා ඇයතන කටයුතු කළ යුතු වේ.

A-9 මාර්ගය විවෘත කිරීම නිසා ජනතාව තුළ

අපේක්ෂා දහගත බවක් ඇති වී තිබේ. ප්‍රවාහන කටයුතු වෙනුවෙන් මේ මාර්ගය භාවිත කරන සිවිල් වැසියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතු වේ.

එසේ ම රාජ්‍ය නොවන සංවිධාන වෙත පනවා ඇති සීමා ලිහිල් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. මෙසේ කිරීමෙන් ඔවුන්ට සිය කටයුතු වඩාත් කාර්යක්ෂම ව ඉටු කළ හැකි වනු ඇත.

# මන්නාරම

**ව්‍යුහයන්**
ෂෙල් ප්‍රහාර හා ගුවන් ප්‍රහාර නිසා ත්‍රිකුණාමලය හා වව්නියාව රෝහල්වල සිට සිවිල් වැසියන් සෑහෙන සංඛ්‍යාවක් මන්නාරම රෝහලට මාරු කර ඒවා ඇත. මේ නිසා අන්තර්ජාතික රතු කුරුස සංවිධානය, Handicap අන්තර්ජාතිකය, කරිටාස් සංවිධානය, සර්වෝදය හා සෙසු මානුෂීය සංවිධානයන් කාර්යබහුල වී තිබේ. වෛද්‍යවරුන් රාශියක් හා අවසන් වසර හෙද සිසුවියන් ද දැනට මන්නාරම රෝහලේ සේවය කරති. උගුර හා කණ පිළිබඳ විශේෂඥවරයෙක්ගේ සේවය තඩිනම් ව අවශ්‍ය වී ඇත. මේ හා සම්බන්ධ රෝගීන් 100 පමණ වේ.

මේ මාසය තුළ පැහැරගෙන යාම් හා වරින් වර සිදු වූ වෙඩි තැබීම් වාර්තා වී තිබේ. කප්පම් ඉල්ලමින් ව්‍යාපාරිකයන් වෙත ලැබුණු දුරකථන ඇමතුම් ද වාර්තා වී තිබේ. දිස්ත්‍රික්කය තුළ වරින් වර සෝදිසි මෙහෙයුම් සිදු වේ. මේ අතර අභ්‍යනතර අවතැන්වූවන් 13 දෙනෙක් ඉන්දියාවේ ආරක්ෂාව පතා ඇත.

වී අස්වනු නෙළීම ආරම්භ වී ඇති අතර මන්නාරමේ මිලදී ගැනීමේ ස්ථාන හා ගබඩා නොමැති වීම නිසා වී අස්වනුවලින් 80 පමණ ප්‍රමාණයක් වවුනියාව හා අනුරාධපුර ප්‍රදේශ වෙත යැවේ. පසුව මන්නාරමේ පාරිභෝගිකයින්ට වැඩි මිලට සහල් අලෙවි කිරීම සිදු වේ. දැනට දිස්ත්‍රික්කය තුළ හාල් කිලෝවක මිල ආසන්න වශයෙන් රුපියල් 75 පමණ වේ. මුහුදු මාර්ග ඔස්සේ ශ්‍රී ලංකා යුද හමුදාවේ සෙබළු හා අවි ආයුධ ප්‍රවාහනය සිදු වී ම නිසා දිස්ත්‍රික් කිහිපයක ධීවරයින් 3000කට පමණ ධීවර කටයුතුවල යෙදීමට සීමා පනවා ඇත.

හින්දු බහුතරයක් වෙසෙන දිස්ත්‍රිකක්යක් වන මන්නාරමේ හින්දු වැසියන්ට මහා සිව රාත්‍රී උළෙල උත්සවාකාරයෙන් සැමරීමේ අවස්ථාව හිමිවිය. මේ අතර මන්නාරමේ රදගුරුතුමාට අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරුවලට යාමේ අවසරය හිමිවිය.

දකුණ කරා යාමට පනවා ඇති සීමා තවමත් පවතින අතර බොහෝ දෙනෙකුට මැදවච්චිය හමුදා මුරපොළෙන් පිටවී යාම ප්‍රතික්ෂේප කර තිබේ. මේ අතර පසුගිය දින කිහිපය තුළ දිස්ත්‍රික්කයේ ඊමේල්, ෆැක්ස් හා ජංගම දුරකථන සේවාවන් ඇනහිට තිබුණි. එසේම දැඩි වැසි නිසා වරින් වර විදුලි සැපයුමට ද බාධා පැමිණෙනු දැකිය හැකි විය.

**ක්‍රියාකාරින්**
රජයේ නිළධාරීන්, ආරක්ෂක අංශ, රාජ්‍ය නොවන සංවිධාන, අභ්‍යන්තර අවතැන් වූවන් ප්‍රධාන ක්‍රියාකාරින් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**
වන්නියේ සිට විශාල වශයෙන් මන්නාරමට පැමිණෙමින් සිටින අභ්‍යන්තර අවතැන්වූවන් දැඩි සේ අවධානයට ලක් වී තිබේ. මන්නාරම රෝහල එහි සම්පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මකවන අතර දිනෙන් දින වැඩිවන රෝගීන්ට පහසුකම් සැපයීම එම රෝහලට දුෂ්කර කාර්යයක් වී තිබේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**
දිස්ත්‍රික්කය තුළ වී අස්වනු මිලදී ගැනීමේ හා ගබඩා කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීමට රජය හා සංවර්ධන නියෝජිත ආයතන පියවර ගත යුතු වේ. එමගින් දිස්ත්‍රික්කයේ වී අස්වනු පිටතට යාම වලක්වා ගොවීන්ට මෙන් ම පාරිභෝගිකයන්ට ද සාධාරණ මිලක් ලබා දිය හැකි වනු ඇත. එසේම මන්නාරම් දිස්ත්‍රික්කයේ දකුණු ප්‍රදේශයේ වගා කටයුතු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සොයා බැලිය යුතු වේ. ඒ අතර ම මාළු ගබඩා කිරීමේ කටයුතු සඳහා සීත ගබඩාවක් ඉදි කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. මෙසේ සිදු කිරීමෙන් දකුණට වැඩි මාළු ප්‍රමාණයක් එවීමට හැකි වනු ඇත.

චුන්ඩිකුලම් දක්වා දුම්රිය මාර්ග දික් කිරීමේ හැකියාව සම්බන්ධයෙන් ද සොයා බැලිය යුතු වේ. මෙමගින් භාණ්ඩ ප්‍රවාහනය වඩාත් කාර්යක්ෂම වනු ඇති අතර සිවිල් ජන සංචලනය කෙරෙහි පනවා ඇති සීමා ද ලිහිල් වනු ඇත.

ශෛල්‍යකර්ම සිදු කරන ලද රෝගීන් වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා පාසැලක හෝ පොදු ගොඩනැගිල්ලක වෛද්‍ය පහසුකම් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් මානුෂීය සහන සේවා සංවිධානවලට අවධානය යොමු කළ හැකි වේ.

මේ ආකාරයේ සංවිධාන වලට දිස්ත්‍රික්කය තුළ සිය කටයුතු පුළුල් කළ හැකි නම් කෘත්‍රිම අවයව සවි කිරීමේ කටයුතු වර්ධනාත්මකව සිදු කළ හැකි වනු ඇත.

# ත්‍රිකුණාමලය

**ව්‍යුහයන්**
වසරක පමන කාලයක් අළුත්වැඩියා කටයුතු නිසා යාත්‍රා නොවූ සේරුවිල 2 මගී නෞකා යලි ත්‍රිකුණාමලය හා මුත්තූර් අතර ප්‍රවාහන කටයුතු ආරම්භ කර තිබේ. කෙසේ වෙතත් මෙහි ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් ජනතාව සිය අප්‍රසාදය පළ කරති. එසේම ගාස්තු අඩු කරන මෙන් අදාල බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

වන්නියේ පවතින ගැටුම්වලින් තුවාල ලැබූ සිවිල් වැසියෝ දිගින් දිගට ම ත්‍රිකුණාමලයට පැමිණෙමින් සිටිති. වඩාත් බරබතල තත්ත්වයේ අයට ත්‍රිකුණාමලයේ දී ම ප්‍රතිකාර කෙරෙන අතර සෙසු අය වෙනත් දිස්ත්‍රික්කවලට ප්‍රවාහනය කෙරෙති.

පැහැර ගෙන යාම් හා ඝාතනය කිරීම් ද දක්නට වේ. බොහෝ විය ගොදුරු බවට පත්වන්නේ පවුලේ එකම ආදායම් උපයන්නා නිසා බොහෝ පවුල් මානසික වශයෙන් දැඩි පීඩනයකට ලක් වී සිටිති. කප්පම් ඉල්ලමින් පැහැරගෙන ගිය සය හැවිරිදි දැරියක් අමානුෂික ලෙස ඝාතනය කිරීම පසුගිය කාලයේ රටපුරා කතාබහට ලක්විය. හේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් පස් දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇති අතර මේ අතරින් දෙදෙනෙක් පොලිස් අත්අඩංගුවේ සිටිය දී මිය ගොස් ඇත.

**ක්‍රියාකාරීන්**
රජයේ ආරක්ෂක අංශ, රාජ්‍ය බලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන හා යුද්ධය නිසා තුවාල ලැබූ සිවිල් වැසියන් ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**
සය හැවිරිදි ජුඩ් වර්ෂා රෙජී දැරිය පැහර ගෙන ගොස් ඝාතනය කිරීම එම සිදුවීමේ ඇති දරුණු බව නිසා ම මුළු දිස්ත්‍රික්කය ම කළඹවාලීමට සමත් වී ඇත. මෙය දෙමාපියන් හා පාසැල් බලධාරීන් අතර භීතියක් ඇති කිරීමට හේතු වී තිබේ.

පොලිසිය මේ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට සමත් වී ඇතත් ආරක්ෂක පියවර තවදුරටත් දැඩි කළ යුතු බව පෙනී යන්නේ මෙම සිදුවීමේ සැකකරුවන් එක්තරා දේශපාලන පක්ෂයක සාමාජිකයන් වීම නිසාය. මානව හිමිකම් උල්ලංඝනය වූ පුද්ගලයන්ගේ තත්ත්වය සමනය කිරීම සම්බන්ධයෙන් කිසිම වැදගත් පියවරක් ගෙන ඇති ආකාරයක් නොපෙනේ. මෙයට හේතු වී ඇත්තේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන අල්ප වීම බව සිතිය හැකිය.

**ක්‍රමෝපායන් හා විකල්ප**
දිස්ත්‍රික්කය තුළ සිදුවන පැරා මිලිටරි ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. මෙම පැහැර ගැනීම් වැඩිවී ඇති බව සය හැවිරිදි වර්ෂා ගේ සිදුවීම මගින් තහවුරු වේ. දෙමාපියන්, විශේෂයෙන් ම විදේශ රටවල සේවය කරන දෙමාපියන් හා ව්‍යාපාරික දෙමාපියන් සිය දරුවන් සම්බන්ධයෙන් බියට පත් වී සිටිති. මේ සම්බන්ධයෙන් ආරක්ෂක පියවර වැඩි දියුණු කළ යුතු වේ.

මානව හිමිකම් උල්ලංඝනය වූවන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අවධානයක් යොමු කිරීමට බලධාරීන් පියවර ගත යුතු වේ. මානව හිමිකම් උල්ලංඝනය වූවන් සංඛ්‍යාව ඉහළ යමින් පවතින අතර ඔවුන්ට සහනටක් සැලසීම වැදගත්ය.

මේ අතර යුද්ධය නිසා එසේත් නැත්නම් පැහැරගෙනයාම් හෝ ඝාතනයන් නිසා සිය පවුලේ එකම ආදායම් උපයන්නා අහිමි වීමෙන් අසරණව සිටින පවුල්වලට තිරසාර ජීව නෝපාය මාර්ග සලසා දිය යුතුය.

# වව්නියාව

**ව්‍යුහයන්**
වන්නියේ සිට එන අභ්‍යන්තර අවතැන්වූවන් 39000 අධික ප්‍රමාණයක් සමග වව්නියාව නගරය බෙහෙවින් කාර්යබහුල ස්ථානයක් වී තිබේ. මෙසේ පැමිණුන අයගෙන් 1750ක් ත්‍රිකුණාමල රෝහලෙන් ප්‍රතිකාර පතා ආ රෝගීහු වූහ. දිගින් දිගටම පැමිණි අභ්‍යන්තර අවතැන්වූවන්ගෙන් පසුව පැමිණියේ සිය නෑ මිතුරන් සොයා එන පිරිසයි. එසේම විශාල

වශයෙන් සිදු වූ අභ්‍යාන්තර අවතැන් වූවන්ගේ ආගමනයෙන් පසු රාජ්‍ය නොවන සංවිධාන, ආරක්ෂක හමුද, මාධ්‍යවේදීන්, දේශපාලකයින් හා දේශීය විදේශීය ආගමික සංවිධානවල නියෝජිතයින් ආදිපාර්ශ්වයන් හි පැමිණීම සිදු විය.

වන්නි අවතැන් වූවන් දැනට කඳවුරු 14ක රඳවා සිටින අතර නිවාස, ආහාර, ජලය හා සනීපාරක්ෂාව යන මූලික පහසුකම් සපයා ඇත. මේ පහසුකම් වැඩි දියුණු කළ යුතු අතර සම්පත් සීමිත වීමෙන් හා අවැතැන්වූවන් සංඛ්‍යාව වැඩි වීමෙන් මේ මුළු පද්ධතිය බිඳ වැටීම වලක්වා ගත යුතුවේ. කඳවුරුවල සිටින පිරිස වැඩි වීම නිසා බෝවන රෝග පැතිර යාමේ අවදානම වැඩි වී තිබේ. මෙම අතිරේක අවතැන්වූවන්ට නවාතැන් සපයා දීම සඳහා චෙට්ටිකුලම් මැණික් කඳවුරේ තාවකාලික නිවාස 24000 ඉදි කිරීමට රජය සැලසුම් සකස් කර තිබේ.

දරුවන් 7500 පමණ ප්‍රමාණයකට කඳවුරු තුළ වන තාවකාලික පාසැල්වල දී අධ්‍යාපනය ලැබීමේ පහසුකම් සපයා දී ඇති අතර වව්නියාව දිස්ත්‍රික්කයේ දරුවන් 25000 පමණ ප්‍රමාණයකට අධ්‍යාපනය අහිමි වී ඇත්තේ දිනෙන් දින වැඩි වන අවතැන් වූවන්ට නවාතැන් සැපයීම සඳහා ඔවුන්ගේ පාසැල් යොදා ගෙන තිබීම නිසාය. මෙයට පිළියමක් සේ මේ පාසැල් තාවකාලිකව පල්ලි, පන්සල් හා වෙනත් පොදු ගොඩනැගිලි-වල පවත්වාගෙන යාමට අධ්‍යාපන අමාත්‍යංශය විසින් සැලසුම් සකස් කෙරමින් තිබුණත් මෙම පහසුකම් අවශ්‍ය ප්‍රමාණයට කිසිසේත් ම නොසරිලයි.

වයස අවුරුදු හැටට වැඩි පුද්ගලයන්ට කඳවුරුවලින් පිටවී සිය නෑ සියන් සමග විසීමේ අවසර ලබා දීමට රජය කටයුතු කර තිබේ. අවුරුදු හැටට වැඩි පුද්ගලයින් 1900 පමණ කඳවුරුවල වෙසෙන අතර මේ අතරින් වැඩිහිටියන් 650ක් පමණ මෙසේ පිටව යෑමට අයදුම් පත් ඉදිරිපත් කර තිබේ. මේ අතරින් 74 දෙනෙකුට පිටව යෑමට අවසර ලැබී තිබේ.
කඳවුරුවල වෙසෙන මානසිකව හා ශාරීරිකව අබාධිත වූ පුද්ගලයින්ට සහන සැලසීමෙහි ලා මානුෂීය සහන සේවා ආයතන කටයුතු සකස් කරමින් සිටියි. කෘත්‍රිම අවයව ලබා දීම හා රෝද පුටු ලබා දීම මෙයට අයත් වේ. එසේම කඳවුරුවල වෙසෙන ගර්භණී මාතාවන් 750ක් පමණ පිරිසකට ද ආධාර ලබා දීමේ කටුයුතු සිදු වෙමින් පවතියි. මේ අතර මන්නාරමේ අගරදගුරුතුමා මැතක දී කඳවුරු වෙත පැමිණි අතර ළඟදීම කඳවුරු තුළ හින්දු දේවස්ථාන හා පල්ලි ආරම්භ කිරීමේ සැලසුම් සකස් කර තිබේ.

A-9 මාර්ගය විවෘත කිරීමත් සමග යාපනයට මෙන්ම යාපනයේ සිට පිට ප්‍රදේශවලට සිදු කෙරන ප්‍රවාහන කටයුතු වැඩි දියුණු වී ඇති අතර මේ නිසා විවිධ නිෂ්පාදය සුලබ වීම ජනතාව දිරි ගන්වන සාධකයක් බවට පත් වී ඇත.

### ක්‍රියාකාරීන්

ප්‍රාදේශීය රාජ්‍ය බලධාරීන්, ආරක්ෂක අංශ, අභ්‍යන්තර අවතැන්වූවන්, රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

### ක්‍රියාත්මක වන ආකාරය

දිගින් දිගටම දිස්ත්‍රික්කය කරා ඇදී එන අභ්‍යන්තර අවතැන්වූවන් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ආකාරයට බෙහෙවින් බලපා තිබේ. මේ හේතුව නිසා රජය, මානුෂීය සහනසේවා ආයතන හා දිස්ත්‍රික්කය තුළ ඇති විවිධ සම්පත් මත විශාල බරක් පැටවී තිබේ. මෑතක දී ඇති වූ අධික වැසි නිසා අභ්‍යන්තර අවතැන්වූවන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු විය. වර්ෂාව හේතුවෙන් අභ්‍යන්තර අවතැන්වූවන්ගේ නිවාස වතුරින් යටවීම, වැසිකිලි පිටාර ගැලීම හා වසංගත රෝග පැතිරී යාම සිදු විය.

දිස්ත්‍රික්කය පුරා දරුවන් 25000 අධික ප්‍රමාණයක ගේ අධ්‍යාපනයට බාධා පැමිණීම සම්බන්ධයෙන් දෙමාපියෝ නොසන්සුන්ව සිටිති. පාසැල් නැවත ආරම්භ කරන දින-යක් ගැන අනාවැකි පැවසිය නොහැකි අතර දැනට දිස්ත්‍රික්කයේ පාසැල් 10ක රැඳී සිටින අභ්‍යන්තර අවතැන්වූවන් රැඳවිය හැකි වෙනත් ස්ථාන තවමත් හඳුනාගෙන නොමැති නිසා මේ දිනය තව තවත් ඈතට යනු ඇත.

### ක්‍රමෝපායන් හා විකල්ප

අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් ප්‍රමාණවත් නිවාස පහසුකම් සැපයීම සඳහා තවත් කඳවුරු ස්ථාපනය කළ යුතු වේ. එසේම මේ කාර්යයේ දී පාසැල් හා වාණිජ ගොඩනැගිලි යොදා ගැනීම නිසා අධ්‍යාපනයට හෝ වාණිජ කටයුතුවලට බාධා පැමිණීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. මෙහි දී රජයට විවිධ අනුග්‍රාහක සංවිධාන හා එක්ව කටයුතු කළ හැකිය. දැනට පවතින කාලගුණක තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් නිවාස ඉදිකිරීම වැදගත් වේ.

අභ්‍යන්තර අවතැන්වූවන්ට කිසියම් ආකාරයක තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම කළ යුතුය. මෙමගින් පරිපාලන කටයුතු මෙන් ම සම්පත් පරිහරණය ද කාර්යක්ෂම කර ගත හැකිය.

දිස්ත්‍රික්කය පුරා ජනතාවගේ සිත් සතන් තුළින් බිය පලවා හැර ඔවුන්ට සාමකාමීව ජීවත් වීමට නම් පැරා මිලිටරි ක්‍රියාකාරම් වැලැක්වීම සම්බන්ධයෙන් පොලිසිය වඩාත් සක්‍රීය ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු වේ.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න

http://www.humanitarian-srilanka.org/Knowledge_Centre/ Publications.php

මානුෂිය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්‍ෂණික තතු විමසුම** මගින් මානුෂිය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරිමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂිය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්‍ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරිම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙහෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙන්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය
feedback@cha.lk

මානුෂීය සේවායතන සමූහය,
30/81, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
දුර/ෆැක්ස්: 94-112506855/2598413